The Journal of the Faculty of Humanities (JHU) (2025), Volume 33, Issue 1, 109-136
ISSN 1391-5096 (Print), ISSN 2783 – 8951 (Online)

# සමාජ වෘත්තවේදය තුළ සෞන්දර්ය කලා භාවිතය : සංකල්පීය න්‍යායික ක්‍රමවේද සහ ප්‍රවේශ පිළිබඳ සංසන්දනාත්මක විශ්ලේෂණයක්

ආචාර්ය ජගත් බණ්ඩාර පතිරගේ

## Abstract

The integration of arts and art-related practices within social work is increasingly recognized worldwide as a valuable approach to addressing complex social and individual challenges. Existing research and theoretical discourse not only showcase successful applications of arts-based methods in social work but also expose significant theoretical, methodological, and epistemological divides between these two fields of knowledge. While the incorporation of arts in social work can lead to more meaningful and transformative outcomes, this integration remains a complex and challenging task. These challenges largely stem from the differing epistemological foundations underlying artistic and social work practices. A detailed examination of social work curricula in Sri Lankan universities and several academic institutions elsewhere reveals a notable absence of arts-based approaches, indicating either limited awareness or insufficient interest in their potential contributions. This study analyzes the curricula of three university programs and one

professional institute through content analysis, supplemented by informal discussions with educators involved in social work teaching. Findings suggest that two primary barriers hinder the integration of arts in social work education: a lack of proficiency in both artistic and social work knowledge, and the prevailing positivist orientation that positions social work chiefly as a scientific discipline. Overcoming these barriers is crucial for fostering more holistic, creative, and empowering approaches within social work education and practice. This paper argues that embracing arts-based methodologies can enrich social work's capacity for social transformation and enhance its responsiveness to diverse client needs.

## හැඳින්වීම් සහ සාහිත්‍ය විමර්ශනය

මානවයා මුහුණ දෙන අර්බුද සහ ගැටලු මානව සත්තාවේ අනිවාර්ය ලක්ෂණයකි. මෙම අර්බුද හෝ ගැටලු මනෝකායික චර්යා හෝ ජෛවීය සාධක පදනම් කරගත් කේවල ප්‍රශ්න හෝ යම් සමාජ කණ්ඩායමක් පොදුවේ මුහුණ දෙන ප්‍රජාව හෝ කණ්ඩායම් ගැටලු විය හැක. උදාහරණයක් ලෙසට අංගවිකලව ඉපදීම හෝ යම්කිසි කායික හෝ මානසික රෝගී තත්ත්වයකින් පීඩා විඳීම යම්තාක් දුරකට පුද්ගලබද්ධ ගැටලුවක් ලෙස සැලකිය හැකි අතර ජන වර්ගයකට අයත් වීම නිසා සමාජයෙන් බැහැර කිරීම, අධ්‍යාපනය හෝ වෙන යම් දෙයකට ඇති සමාන අවස්ථාවන් අහිමි කිරීම වාර්ගික හෝ කණ්ඩායම් ගැටලුවක් ලෙස ගිණිය හැකි වේ. බොහෝ අවස්ථාවල පුද්ගලබද්ධ සහ සමාජීය ගැටලු අතර බෙදුම් ඉර ඉතාමත් සිහින් වන අතර මෙම සාර්ව සහ සූක්ෂ්ම තල ඡේදනය වීමට ද ඉඩ තිබේ.

පුද්ගලබද්ධ හෝ සමාජීය වේවා මෙවන් ගැටලුවලට පිළිතුරු සෙවීම් අනිවාර්ය සමාජ අවශ්‍යතාවකි. ඒ පිළිබඳව ගවේෂණය කිරීමට සහ ප්‍රතිපත්ති සංවර්ධන සම්පාදනයට බොහෝ ශික්ෂණ විවිධ එළැඹුම් සහ න්‍යායික ප්‍රවේශ ගොඩනගා ඇති අතර සමාජ වෘත්තවේදය මානව සහ සමාජීය ගැටලු ආමන්ත්‍රණය උදෙසාම ගොඩනැගුණු ශික්ෂණයක් වේ. සමාජ විද්‍යාව, මනෝ විද්‍යාව සහ මානව විද්‍යාව වැනි විෂයයන්වලින් න්‍යායික පථය පුළුල් කරගත් සමාජ වෘත්තවේදය

වර්තමානය වන විට සමාජීය සහ මානව ශාස්ත්‍ර පමණක් නොව ලලිත කලා යන විෂයයන්ගෙන් ද ආලෝලනය වෙමින් එහි ක්‍රමවේදය සහ න්‍යායික එළැඹුම් පුළුල් කර ගනිමින් සිටියි. මෙම ලිපියේ දී සමාජ වෘත්තවේදය සමාජ ගැටලු විසඳීමට ලලිත කලාවන්ගෙන් සහ සෞන්දර්ය විෂයයන්ගෙන් ආභාසය ලබමින් එය න්‍යායික සහ ක්‍රමවේදීය පරිදි පුළුල් කර ගැනීම සඳහා ඇති සීමා විමසා බැලීමට උත්සාහ කරනු ලැබේ.

තියුණු වූ ද, සංකීර්ණ වූ ද සමාජ ගැටලු ආමන්ත්‍රණය උදෙසා කලා මාධ්‍ය භාවිතය පිළිබඳව ශාස්ත්‍රඥයන්ගේ අවධානය වර්ධනය වෙමින් පවතින අතර එය ජනප්‍රිය වීමට හේතුව වී ඇත්තේ එහි ඇති විපරිවර්තන ගුණය නිසා වේ. හස් (2012) දක්වන ආකාරයට, ආන්තික වූ ජන කණ්ඩායම්වලට මෙන්ම පොදුවේ බොහෝ දෙනාට තම අනන්‍යතා අර්බුද මෙන්ම ක්ෂතිමය තත්ත්වවලදී උපකාරී වීමට කලාව අවාචික මාධ්‍යයක් සම්පාදනය කර දේ. මෙහි දී අවාචික යනුවෙන් අදහස් කෙරෙන්නේ අවාචික කලා පමණක්ම නොවේ. තම ගැටලු ඍජුව ප්‍රකාශ කෙරෙනවා වෙනුවට නිර්මාණශීලි ලෙස භාවිත කිරීමයි. හස් සහ විකෙල්ට (2005) අනුව පුද්ගලයින්ට තම ගැටලු ආමන්ත්‍රණය කිරිමේ දී මතු විය හැකි භාෂාමය සහ සංස්කෘතික සීමා අතික්‍රමණය උදෙසා අවශ්‍ය වේදිකාවක් කලාව මඟින් තනා දෙනු ලැබේ. එමඟින් ඔවුන්ට තම පුද්ගලභාවය වර්ධනය කිරීමට අවශ්‍ය බලායනය කිරීමේ හැකියාව ද ලැබෙනු ඇත. සුවිශේෂ වෘත්තීයමය ආඛ්‍යාන මඟින් ගොඩනංවන වාචික, මහෝත්මභාවයට මෙන්ම බාධාකාරී, සාම්ප්‍රදායික, සාමූහික අධ්‍යයන මඟින් සඟවන ලද, සම්පත් මඳකම නිසා ඇතිවුණු ව්‍යුහාත්මක ගැටලු සහ නෛතික භාවයට පත්කොට ඇති මර්දනවලට අභියෝග කිරීමට එයට ඉඩ ලැබේ (Dominelli 2006; White and Epston 1990). එසේම කලාව මූලික කොටගත් සමාජ වෘත්තවේදී භාවිත තම වෘත්තීය අවලෝකන, චිත්තවේගී ප්‍රකාශන සහ ප්‍රජා ගොඩනැංවීම් උදෙසා දායකවන ආකාරය පෙන්වා දෙයි (Boal, 1979; McNiff, 2008).

විවිධ කණ්ඩායම් අතර සංවාද ගොඩනැංවීමත්, සමාජ අන්තර්කරණයට මැදිහත් විය හැකි ආකාරයත්, එකිනෙකා තේරුම් ගැනීම උදෙසා කලාව භාවිත කළ හැකි ආකාරය පිළිබඳවත්, සහභාගී කලා ව්‍යාපෘති භාවිත කළ හැකි ආකාරය පිළිබඳවත් හස් (2015)

පෙන්වා දෙයි. ලෙවි (2015)ට අනුව නම් අදාළ පුද්ගලයාගේ අභ්‍යන්තර ගැටලු සහ සමාජ යථාර්ථය තේරුම් ගැනීම උදෙසා පොහොසත් මෙන්ම සියුම් දත්ත ලබා ගැනීමේ පදනමක් ලෙසට කලාව පදනම් කරගත් පර්යේෂණ ක්‍රමවේද මඟින් ලැබෙනු ඇත.. එසේම Mishíh and Bogo (2007) Ward (2001) පෙන්වා දෙන පරිදි කලාව මඟින් සමාජ වෘත්තවේදියකුගේ චිත්තවේගී ප්‍රතිචාර ඇතුළට ගමන් කිරීම හෝ පාලනය කරමින් ඒවා හඳුනා ගැනීමටත් රාජකාරියෙහි ආරක්ෂාකාරී ලෙස නිමග්න වීමටත් ඉඩ සලසා දෙයි. මෙය වන්නේ තමාගේ සහ අනෙකාගේ චිත්තවේගී ප්‍රතිචාර සමඟ අන්‍යෝන්‍ය ලෙස ගනුදෙනු කිරීමට ලැබෙන හැකියාව මඟිනි. කුමන සීමාකම් තිබුණ ද කලා භාවිතය සමාජ වෘත්තවේදියකුට තම සේවාලාභියා සුවපත් කිරීමට, බලායනය කිරීමට මෙන්ම උපදෙස් සම්පාදනය උදෙසා ද අවශ්‍ය නිර්මාණශීලී උපකරණයක් වනු ඇත.

සමාජ ප්‍රශ්නවලට ආමන්ත්‍රණය කිරීමේ දී සමාජ වෘත්තවේදය සහ ලලිත කලා ආදි සෞන්දර්යය විෂයයන්ගේ සීමා කවරේ ද? මෙම අධ්‍යයනයෙන් ද විමසා බැලෙන්නේ ඒ ඒ විෂය ප්‍රවේශවල මතුවන සංකල්පීය න්‍යායික සහ ක්‍රමවේද සීමා සහ ආතති මොනවාද, එවැනි ආතති සමහන් කර ගැනීමේ ප්‍රවේශ කෙබඳු දැයි සොයා බැලීමයි. එනම් ඒ ඒ විෂයයන්ට අදාළ ඒ ඒ විෂයයන් මඟින් ආමන්ත්‍රණය කෙරෙන වාද විෂයයන් උදෙසා සම්පාදනය කෙරෙන ඊටම අනන්‍ය වූ න්‍යායික සංකල්පීය සහ ක්‍රමවේදීය එළඹුම් තිබේ. ඒ අනුව එකම ගැටලුවක් දෙස ශික්ෂණ කිහිපයකින් බැලෙන දෘෂ්ටිකෝණ විවිධ විය හැකිය. ඒ නිසාම එම ගැටලුව ආමන්ත්‍රණය කෙරෙන ආකාර ද විවිධ විය හැකි අතර යම් විටෙක එම ගැටලු ආමන්ත්‍රණය කිරීම සඳහා අන්තර් විෂයයීය (interdisciplinary) මැදිහත්වීමක් කරන්නේ නම් ඥාන විභාගාත්මක වශයෙන් මතු වන්නා වූ වෙනස්කම් හේතු කොටගෙන ඇතිවන සංකල්පීය න්‍යාය සහ ක්‍රමවේද මතුවීමට ද ඉඩ තිබේ. එබැවින් මෙහි දී උත්සාහ කෙරෙන්නේ සමාජ ප්‍රශ්න කෙරෙහි ඍජුවම මැදිහත්වීමක් කෙරෙන සමාජ වෘත්තවේදය වැනි විෂයයන් තම ඥාන විභාගාත්මක අඩවියෙන් පරිබාහිර දැනුම් ශාඛාවක පිහිටා ගැනීමේ දී මුහුණ දෙනු ලබන එම න්‍යායක සංකල්පීය සහ ක්‍රමවේදීය පරසරස්පරතා මඟහරවා ගනිමින් එම සීමා ජය ගන්නේ කෙසේදැයි විමසා බැලීමටය.

## අධ්‍යයන අරමුණ

මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණ වූයේ ශ්‍රී ලංකේය ශාස්ත්‍රාලීය අධ්‍යයනය තුළ සමාජ වෘත්තවේදය ඉගැන්වීමේදී කලාව සමාජ ගැටලු ආමන්ත්‍රණය උදෙසා භාවිතයට ගතහැකි ආකාර පිළිබඳ කොතරම් සවිඥානක ද, එහි දිශානතිය කෙබඳුදැයි දැයි ගවේෂණය කිරීමයි.

## පර්යේෂණ ක්‍රමවේදය

ඒ අනුව මේ ලිපියේ දී සෞන්දර්ය කලාවන්ගේ සහ සමාජ වෘත්තවේදය නමැති විෂයයේ ඇති මූලික ලක්ෂණ කිනම් ඒවා දැයි ගෙනහැර දක්වමින් ඒ සුවිශේෂී ගුණ සමාජ වෘත්තවේදය නම් විෂයයෙහි ඇති සීමා ජය ගනිමින් වඩා හොඳ සේවාවක් සැපයීම සඳහා කලාව පාදක කරගත හැකි ආකාරය පිළිබඳව සාකච්ඡා කෙරේ. මෙම අධ්‍යයනය සඳහා මූලික වශයෙන් පවතින සාහිත්‍යයේ පිහිට පැතූ අතර ඒ පිළිබඳව ගෝලීය වශයෙන් පළ වී ඇති සාහිත්‍යය විශ්ලේෂණාත්මකව පරිශීලනය කෙරිණි. ලංකාව වැනි රටක සමාජ වෘත්තවේදය පුහුණු කරන ප්‍රධාන ආයතන ගණනාවක විෂයමාලා තුළට කෙතරම් දුරට සෞන්දර්ය කළා අන්තර්ග්‍රහණය කෙරී ඇති දැයි විමසා බැලූ අතර එලෙස අන්තර්ග්‍රහණයට ඇති නොහැකියාවන් සඳහා බලපාන ලද බුද්ධිමය හෝ ව්‍යුහාත්මක තත්ත්ව පිළිබඳ සාකච්ඡා කෙරිණි.

මේ ලිපිය න්‍යායික විශ්ලේෂණයක් වන අතර ලංකාවේ සමාජ වෘත්තවේදී පාඨමාලා පිළිබඳ විමසමින් එහි අන්තර්ගතය විශ්ලේෂණයකට බඳුන් කළ අතර තෝරාගත් ආචාර්යවරුන් සමඟ ඒ ඌනතාව පිළිබඳ සංක්ෂිප්ත සාකච්ඡාවක් පවත්වන ලදි. මේ ක්ෂේත්‍ර දත්ත විශ්ලේෂණයේ පැනෙන කාරණා සහ මූලික භාවිත පිළිබඳව ශ්‍රී ලංකාවේ ප්‍රවණතා යන කොටසින් සාකච්ඡා කෙරිණි. එසේ කරන ලද්දේ මූලිකවම මෙය න්‍යායාත්මක ලිපියක් වන බැවිනුත් එවන් සන්දර්භයක් නොමැති අවකාශයක ඒ සඳහා යම්කිසි ආකාරයක න්‍යායාත්මක විශ්ලේෂණයක් කිරීමේ මූලික අරමුණත් වෙනුවෙනි.

# තාර්කිකත්වය සහ පරිකල්පනය (Ratioílity and Imagiítion)

සමාජ වෘත්තවේදය විෂයයක් ලෙසට න්‍යායිකව ස්ථානගත වන්නේ සමාජීය විද්‍යා අඩවියේ නම් ඒ ක්‍රමවේද, ශිල්ප ක්‍රම සහ න්‍යායික පෝෂණය විද්‍යාත්මක ක්‍රමවලට වැඩි නැඹුරුවක් යොමු කරමින් විද්‍යාත්මක ඥාන විභාගාත්මක පදනමක් මත ගොඩනැඟීමට උත්සාහ දරයි. ඒ අනුව සමාජ වෘත්තවේදය තුළ විද්‍යාව අධිනිශ්චය වීම එහි ඥාන ගවේෂණය කිරීමේ සහ එය භාවිත කිරීමේ ක්‍රියාවලිය තුළ ම ගැබ්ව පවතී. එසේවතුදු කාලීනව ඉතා ශීඝ්‍ර ලෙස කලා සහ සෞන්දර්යාත්මක ශික්ෂණ පෝෂණය ලැබීම මඟින් සමාජීය ගැටලු විසඳීමට සමාජ වෘත්තවේදය එළැඹෙමින් සිටි. ගැටලුව නම් එකිනෙකට වෙනස් වූ විද්‍යාත්මක සෞන්දන්දර්යාත්මක ඥාන ගවේෂණ අඩවි දෙකක් එකට මුසු වන්නේ කෙසේද යන්නය? වෙනත් ආකාරයකට විමසුවහොත් සංකල්පීයව සහ ක්‍රමවේදීය අන්ත දෙකක පිහිටන ශික්ෂණ දෙකක් මුසුවීමේ ක්‍රමවේදීය එළඹුම් කුමක්ද යන්නයි.

කලාව වනාහි සෞන්දර්යාත්මක, පරිකල්පනීය අවකාශයකි. එහිදී ලෝකය හෝ තමා අවට ඥානනය කිරීමේ සහ ඊට ම මැදිහත් වීමේ තාර්කිකත්වය වනාහි ඊටම අනන්‍ය වූ ක්‍රමවේදයකට අනුව සිදු වේ. කලාවේ තාර්කිකත්වය තුළ විෂය මූලික සංජානන, හැඟීම් හා අත්දැකීම් ගවේෂණය සුවිශේෂී ආකාරයකට සිදුවේ. එය සිදුවන්නේ, සාම්ප්‍රදායික ක්‍රමවලින් ගිලිහී යෑමට ඉඩ තිබෙන අන්තර්ඥාන සංවේදනා මත පිහිටි අවබෝධය සහ අවිඥානික දැනුම් පද්ධති වෙතට ළඟා වීමට ඉඩ සලසා දෙමිනි. (Huss 2018; Walton 2012).

කලා කෘතියක තාර්කිකත්වය, විද්‍යාත්මක ක්‍රමයට අනිවාර්යයෙන් අනුරූප නොවන අතර එහිදී තාර්කිකත්වය පිළිබඳ සාකච්ඡාව ගොඩ නැඟෙන්නේ පරිකල්පනීය මෙන්ම අර්ථකථනාත්මක තලයක වේ. එලෙසම කලාව සහ සෞන්දර්යාත්මක අඩවියෙහි පරිකල්පනීය එළැඹුම මානවශාස්ත්‍රයන්ගේ පරිකල්පනීය එළැඹුමට ප්‍රතිපක්ෂව ස්ථානගත වීමට බොහෝ දුරට ඉඩ තිබේ. මීට ප්‍රතිපක්ෂව සමාජ වෘත්තවේදය ඇතුළත ඥානය ගවේෂණය කරන්නේ විද්‍යාත්මක ක්‍රමවේද මත පදනම් වන අතර තාර්කිකත්වය එහි කේන්ද්‍රය වේ. පරිකල්පනය ක්‍රියාත්මක වන්නේ විද්‍යාත්මක තර්කනය සහ ක්‍රමවේද

මතයි. සමාජ වෘත්තවේදයෙහි මානව ගැටලු විසඳීම හෝ ඒ පිළිබඳව දැනුම් ගොඩනැගීම පරම අභිලාෂය වන අතර කලාවෙහි මානව ගැටලු විසඳීම අනිවාර්ය කොන්දේසියක් නොවේ. ඇතැම්විට එය වක්‍රාකාර මැදිහත් වීමකි. එයට හේතුව නම් කලාවේ මූලික සහ කේන්ද්‍රීය අරමුණ සෞන්දර්යාත්මක සහ පරිකල්පනීය අවකාශයේ බලාත්මක වීමයි. එසේ වුවද මෙම ක්ෂේත්‍ර ද්විත්වයම ඍජුව හෝ වක්‍රව මානව ගැටලු කෙරෙහි යම් මැදිහත්වීමක් කෙරෙන අතර එනිසාම කලාවේ පවතින සුවිශේෂී ගුණය සමාජ වෘත්තවේදයෙහි භාවිත කිරීමට නැඹුරු වෙමින් පවතී.

කලාව මූලික කරගත් ප්‍රවේශ මඟින් ශිෂ්‍යයන්ට මූලික න්‍යායන්ගෙන් ඔබ්බට ගොස් මිනිසුන්ගේ තථ්‍ය ජීවන අත්දැකීම් මත පදනම් වෙමින් ඉතා පොහොසත් න්‍යායික විශ්ලේෂණයන්ට ඉඩ හසර ලබා දෙයි (Walton, 2012). එසේම නව අර්ථ සහ පර්යාලෝක ගොඩනැංවීම මඟින් වේගයෙන් තොරතුරු විශ්ලේෂණය කිරීමටත් ගැටලු විසඳීමටත් කලාව මඟින් හැකි වෙයි (Huss, 2018). අවසානයේ කලාව භාවිත කිරීම මඟින් මූලික අත්දැකීම් සහ වාස්තවික විශ්ලේෂණ අතර ඇති පරතරය අවම කරමින් වඩා හොඳ සන්නිවේදනයක් ඇති කිරීමටත් ඇගයුම් කිරීමට සහ මැදිහත් වීමටත් සමාජ වෘත්තවේදීන්ට හැකි වෙයි.

## සමාජ මැදිහත්වීම

කලාවෙහි පවතින සුවිශේෂී ගුණයක් වන්නේ මානව ගැටලු සඳහා මැදිහත් වීමට අවශ්‍ය පර්යාලෝක (perspectives) තෝරා-බේරා ගැනීම්ට සහ අවශ්‍ය ප්‍රජානක, චිත්තවේගීය (emotional) සහ සංවේදනාත්මක ලාක්ෂණික සමඟ බද්ධ වීමට ඇති හැකියාවයි. Arnheim (1996) උපුටා දක්වමින් Huss පවසන්නේ කලාවෙන් විචාරාත්මක චින්තනයට ඉඩ සැලසෙන්නේ එමඟින් බහුවිධ අර්ථකථන සම්පාදනය කරන බැවින් බවය. මක්නිසාද යත් කලාකෘතියක් කිසිදු දිනෙක තනි අර්ථ සම්පාදනය නොකරන බැවිනි. උදාහරණයක් ලෙසට ඉන්දියානු පහළ කුලවලට එරෙහිව සිදුවන කුල පීඩනය, ස්ත්‍රී දූෂණය සහ සූරාකෑම යන සමාජ අර්බුද විමසා බලමු. වර්තමානයේ පවා ඉන්දීය පහත් කුලවල ජනයා ඉහත ගැටලුවලට දරුණු ලෙස මුහුණ

දෙන අතර මේ සමාජ ප්‍රශ්නයක් ලෙස සැලකිය හැකිය. මේ අරබයා සාහිත්‍යකරණයේ යෙදෙන මහාශ්වේතා දේවී හරිජන ජනතාව කුල පීඩනයට එරෙහිව පාලන ප්‍රතිරෝධය දැනවීම සඳහා 'මාස්ටර් සාහබ්' නමැති නවකතාව රචනා කරයි. උපුල් රංජිත් හේවාවිතනගමගේ විසින් සිංහලයට පරිවර්තනය කරන ලද සෞන්දර්යාත්මක සහ සාහිත්‍යමය පරිකල්පනය පිරි එම නවකතාව සත්‍ය වශයෙන්ම පුද්ගල දේශපාලන සවිඥානය ඇති කිරීමට සහ ඒ සඳහා අධ්‍යාපනයේ ඇති වැදගත්කම අවධාරණය කිරීමට වෙර දරයි. සමාජ වෘත්තවේදියාට මෙවන් සමාජ ගැටලු සඳහා මැදිහත්වීමට නව එළැඹුම් සහ ක්‍රමවේදවල පිහිට පැතීමට සිදුවන අතර බොහෝ විට ඔවුන් නැඹුරු වීමට ඉඩ ඇත්තේ ද කලා සෞන්දර්යාත්මක ප්‍රවිෂ්ට වෙත වීමට පිළිවන. ගැටලුව නම් ප්‍රතිමුඛ න්‍යායික සහ සංකල්පීය ප්‍රවිෂ්ට දෙකක් එකිනෙක සම්මුඛ කර ගන්නේ කෙසේද යන්නයි. නැතහොත් සමාජ වෘත්තවේදය ඇතුළත එම සෞන්දර්යාත්මක එළැඹුම් අන්තර්කරණය කරගන්නේ කෙසේද යන්නයි.

ඉහත ගැටලුවට පිළිතුරු සෙවීම් සඳහා සමාජ වෘත්තවේදය අවධාරණය කරගත යුතු මූලික කරුණු දෙකක් පවතී. ඉන් පළමුවැන්න නම් අවශ්‍ය තැන්හි දී නිසි කලා මාධ්‍ය තෝරා ගැනීමයි. මෙය වෘත්තවේදියකුගේ සෞන්දර්යාත්මක නෛපුණ්‍යතාව මත රඳා පවතී. එනම් එය ක්‍රමවේදීය එළැඹුමක් ලෙස සමාජ වෘත්තවේදයෙහි භාවිත කිරීමයි. දෙවැන්න නම් සමාජ වෘත්තවේදය තුළ කලාව (Rojers, 2001) මාධ්‍යයක් ලෙස භාවිත කිරීමයි. එහිදී කලාව විවිධාකාරයට භාවිත කිරීමට පිළිවන. එනම් නිහඬ කරවනු ලැබූ හඬවල් ගවේෂණය කිරීමට මෙන්ම එම නිහඬ කරවනු ලැබූ හඬවල් අන් අයට ඇසීමට සැලැස්වීමට ද හැකි ආකාරයට එම (Boss and Huss, 2019) සෞන්දර්යාත්මක ප්‍රවේශ භාවිත කිරීමයි. ආන්තිකරණයට (marginalisation) ලක්වූ සමාජ කණ්ඩායමක් සහ ඔවුන්ට පොදු වූ ගැටලුවකට පිළිතුරු සෙවීමට යමෙකුට අවශ්‍ය නම් ගැටලුව සහ ප්‍රජාව ආශ්‍රය කර ගනිමින් නාට්‍යයක් නිර්මාණය කළ හැකි වේ. නාට්‍ය නිර්මාණය කිරීමේ මානවීය අත්දැකීම තුළ වින්දිතයා බලායනය (empower) කරන අතරම (Bos and Huss, 2019) භාව විශෝධනය වීමට ද, ප්‍රකාශ කිරීමට අපොහොසත් වූ ගැටලුව අනෙකාට ඇසෙන්නට සැලැස්වීමට ද හැකිය. මෙහිදී කලා මාධ්‍ය විප්ලවීය ආකෘතිකමය වෙනස්වීමකට ලක් විය හැකි අතර මාධ්‍ය සහ

වින්දිතයන් අතර මෙන්ම ප්‍රේක්ෂකයා සහ සමාජය අතර අන්‍යෝන්‍ය සංවාදාත්මක සන්නිවේදනයකට ඉඩකඩ විවර වීමට ද නිහඬ කරවනු ලැබූ හඬවල් ඇසීමට ද ඉඩ සැලසෙයි.

සමාජ වෘත්තවේදය තුළ අවධානයට ලක් කෙරෙන ඉලක්ක කණ්ඩායම් අතුරින් එක් සමාජ කණ්ඩායමක් නම් අගතියට පත් පුද්ගල කණ්ඩායම්ය. පුද්ගලයන් විවිධ සමාජ කොන්දේසි හෝ වෙනත් සාධක මූලික කරගෙන විවිධ ආකාරයෙන් අගතියට පත්වීමට ඉඩ තිබේ. යම්කිසි සමාජ දේශපාලනික හෝ බලාධිකාරයක ප්‍රතිඵලයක් හේතුවෙන් වින්දිතයන් බවට පත්වීම සමාජයෙන් බහිෂ්කරණය වීම් මෙන්ම කායික හෝ මානසික පීඩාවන්ට ලක් වීමට ඉඩ තිබිය හැකියි. එසේම ඇතැම් විට ලිංගික අපයෝජනයකට ලක් වූ කාන්තාවකට නීතියෙන් පිළිසරණ නැතිවීමට හෝ තම සමාජය මඟින් ම නැවත අපයෝජනයට ලක්වීම, ආන්තීකරණයට ලක් වීමට ද මේ තත්ත්ව දෙකටම මුහුණ දීමට ද සිදුවිය හැකිය. මේ ඔස්සේ වින්දිතයාට තම පුද්ගල ශක්‍යතාව තේරුම් ගැනීමට නොහැකි වීම හේතුකොටගෙන තම ස්වාධිපත්‍යය අහිමි වීම මෙන්ම අනන්‍යතාව ගිලිහී යාමට ද ඉඩ තිබේ. ඒ වනාහි පුද්ගලයකුට යමක් නියෝජනය කිරීමේ සහ සාධාරණ ලෙස යමකුට බලපෑම් කිරීමට ඇති හැකියාවයි. පුද්ගල අනන්‍යතාව පුද්ගල ස්වාධිපත්‍ය තීරණය කිරීමේ ප්‍රධානතම සංරචකයකි. උදාහරණයක් ලෙසට බහුසංස්කෘතික රටක ප්‍රධාන දහරාවේ ජන කණ්ඩායම්කට සුළුතර ජන කණ්ඩායමේ අයකුට වඩා තීරණාත්මකව මැදිහත් වීමේ අවස්ථාව සැලකිය හැකිය. එබැවින් සමාජ අගතියට පත්වීම සමාජීය වශයෙන් ආන්තීකරණය වීම් මෙන්ම ඒ හේතුකොටගෙන පුද්ගල අනන්‍යතාව සහ ස්වාධිපත්‍යය ගිලිහී යෑම එකිනෙකට බද්ධ වූ තත්ත්ව වෙයි.

එවැනි අගතියකට පත් කණ්ඩායමකට මැදිහත් වීමේදී සමාජ වෘත්තවේදියකුට මෙම කරුණු සියල්ල සමස්තයක් ලෙස ගෙන ඊට මැදිහත් වීම කළ යුතුය. මෙහිදී වින්දිතයන් පමණක් නොව පීඩකයෝ එලෙස වෙනසකට ලක්කළ යුතු ප්‍රධාන පාර්ශ්වකරුවෝ වෙති. එවිට අන් සෑමවිටම මෙන්ම සමාජවෘත්තවේදියකුට ද සාකල්‍යමය ප්‍රවේශයක් ඇතුළත වැඩ කිරීමට සිදු වෙයි. උදාහරණයක් ලෙස නීතිය සහ පර්යාය අවභාවිතවීම නිසා පීඩනයට පත් ජන කොටසක් පිළිබඳව සාකච්ඡා කරන්නේ නම් එම සුවිශේෂී ජන කොට්ඨාසය

පිළිබඳ සුවිශේෂීව අවධානයට ගන්නා අතරම ඇතැම් විට එම ජන කොට්ඨාසය නියෝජනය කරන සමස්ත ප්‍රජාව උදෙසා යම් යම් වැඩසටහන් සම්පාදනය කිරීමට සිදුවිය හැකිය. මක්නිසාදයත් පීඩිත මෙන්ම පීඩකයා ද එකම ජන සමාජයක දිවි ගෙවන බැවිනි. මෙවැනි අවස්ථාවක සමාජ වෘත්තවේදයෙහි ඇති ශික්ෂණාත්මක සීමා ජය ගැනීම උදෙසා සෞන්දර්යාත්මක ක්‍රියා සාර්ථක ලෙස භාවිත කළ හැකි වෙයි.

වැදගත් දෙය නම් වින්දිතයාට අනන්‍යතාව සහ ස්වාධිපත්‍යය ගොඩ ගොඩනගා ගැනීමට හැකිවීමයි. Hooks (1992)ට අනුව කලා මාධ්‍ය භාවිත කිරීමේ හැකියාව පුද්ගලයකුගේ ස්වාධිපත්‍යය තහවුරු කිරීමට උපකාරී වෙයි. එහිදී සමාජ වෘත්තවේදියකුට තමන් නිපුණත්වය දරන සහ පුද්ගල ශක්‍යතාවන්ට ගැළපෙන ඕනෑම ආකාරයක කලා මාධ්‍ය භාවිත කිරීමේ හැකියාව පවතී. එය කවිය, ගීතය, චිත්‍ර කලාව හෝ අත්කම්වල සිට නර්තන ශිල්පය, නාට්‍ය හෝ චිත්‍රපට වැනි ඕනෑම කලා මාධ්‍යයක් විය හැකියි. වැදගත් දෙය නම් මෙම භාවිතයේ දී අදාළ කෘතිය නිර්මාණය කිරීම, රසවිඳීම යන ඕනෑම ආකාරයකින් කලා කෘතියට දායකවීමට වින්දිතයාට සහ තම ආඛ්‍යානය ගොඩනැඟීමට වින්දිතයන්ට දිරි දීමයි. වින්දිතයන්ට තමන්ගේ චිත්ත සංකා මුදා හැරීමට ඉඩ සැලසෙන අතර එය ප්‍රථමයෙන් සඳහන් කළ පරිදි කලාව එයැර්චැමඑසජ මාධ්‍යයක් ලෙස ක්‍රියාත්මක වීමේ අවස්ථාවයි. ඒ සමගම වින්දිතයාට තම හඬ මතුපිටට රැගෙන ඒමට සහ ඇතැම් විට තම හඬ තහවුරු කිරීමට ඉඩ සැලසෙන අතර ඒ මඟින් තම අනන්‍යතාව සොයා ගැනීමට ඉඩ ලැබේ (Smiranova & Poluektova, 2023). මෙම ක්‍රියාවලියේදී සමාජ වෘත්තවේදියකුගේ ප්‍රධානතම කාර්යභාරය විය යුත්තේ එම ආඛ්‍යානගත කිරීම් පීඩිත මානසිකත්වයෙන් ඔබ්බට රැගෙන යෑමට දිරි දෙමින් ඔහුගේ හෝ ඇයගේ සමස්ත කණ්ඩායම් අනන්‍යතා සොයා පාදා ගැනීමටත් ඒ ශක්තීන් මතු කර ගැනීමටත් ඉඩ හසර සලසා දීමයි. එමඟින් අනන්‍යතා ස්ථාපනය හරහා පුද්ගල ස්වාධිපත්‍යය තහවුරු කිරීමට ඉඩ ලැබේ.

අනන්‍යතාව හඳුනා ගැනීම සහ භාර ගැනීම යනු කේවල ක්‍රියාවක් නොව සමාජීය ක්‍රියාවලියකි. යමෙකු දරන අනන්‍යතාව පිළිගැනීම්ට තරම් සමාජයේ අනෙකා මතවාදී බවෙන් ප්‍රජාතන්ත්‍රීය විය යුතුය. එය කිරීමට නම් පාර්ශ්ව අතර යහපත් සබඳතාවක් ගොඩනැඟිය

යුතු අතර, එය කිරීමට කලා මාධ්‍ය සතුව ඉහළ විභවතාවක් පවතී. වින්දිතයන් ගොඩනඟන හඬ සහ ආඛ්‍යානය බෙදා-හදා ගැනීම යනු ප්‍රථමයෙන් සංවාදාත්මක සබඳතාවකි. යහපත් සංවාදයක් ගොඩනැඟීමට ප්‍රබල හැකියාවක් කලා මාධ්‍යයට පවතින්නේ එහි භාවිත කරන භාෂාව චිත්තවේගවලට ආමන්ත්‍රණය කෙරෙන බැවිනි. එම චිත්තවේගීය පරිවර්තන හරහා ගොඩනැගෙන සංවාදය මඟින් පීඩිතයාට මෙන්ම වින්දිතයාට ද එකඟ විය හැකි අවකාශයක් නිර්මාණය කිරීමේ හැකියාව පවතින අතරම එහි කුමන පරස්පරතා පැවතිය ද වින්දිතයාට තම අනන්‍යතාව සහ ස්වාධිපත්‍යය ඉතා විශාල සමාජයක් හරහා ප්‍රකාශ කිරීමේ හැකියාව පවතී. උදාහරණයක් ලෙසට සම්භාව්‍ය ග්‍රීක නාට්‍යකරු සොෆොක්ලීස්ගේ 'ඇන්ටිගනි' නමැති නාට්‍යය සලකා බලන්න. එහිදී සාකච්ඡාවට බඳුන් වන ප්‍රස්තුතය නම් නීතියේ සහ රාජ්‍යයත්වයේ බලය මත සිදුවන දේශපාලන ඝාතනය සහ මළ සිරුරු මිහිදන් කිරීමට ඉඩ නොලැබීමේ උභතෝකෝටිකය සහ ඛේදවාචකයයි. මිනිසකුට තම ඥාතියකු අසාධාරණ ලෙසට ඝාතනයට ලක්වීම සහ එම සිරුර දැක ගැනීමට නොහැකි වීම හෝ මිහිදන් කිරීමට ඉඩ නොලැබීම යන ඛේදවාචකය පිළිබඳ තත්කාලීන නිදසුන් ප්‍රමාණවත් තරම් ලොව පුරා මානව විද්‍යාඥයන් විසින් සාකච්ඡාවට ලක් කරනු ලැබ තිබේ. එහිදී පැහැර හරින්නේ පුද්ගල අයිතිය පමණක් නොව පුද්ගල ස්වාධිපත්‍යයයි; ඔවුනොවුන්ගේ දේශපාලන අනන්‍යතාවයි. සොෆොක්ලීස්ගේ මෙම කෘතිය හරහා මෙම ඛේදවාචකයේ තරම මහා සමාජයට මුදා හරියි. පීඩකයා සහ පීඩිතයන් එකම අවකාශයකට රැගෙන එනු ලබයි. එමඟින් සමාජ සාධාරණත්වය පිළිබඳ තර්කය මහා සමාජයේ අර්බුදයට ලක්කරයි. එමඟින් පීඩකයා ද අභියෝගයට ලක් කරමින් වින්දිතයාට ඇහුම්කන් දීමට ඉඩ සලසා දෙයි. සොෆොක්ලීස්ගේ නාට්‍ය සමාජ වෘත්තවේදය උදෙසා කළ නාට්‍යයක් නොවූව ද සමාජ වෘත්තවේදියකුට එය නිර්මාණශීලී ලෙස අර්ථකථනය කිරීමේ හැකියාව පවතී. ප්‍රතිඵල එක් ක්ෂණයකින් සිදු නොවුව ද පීඩකයාගේ බලයට අභියෝග කිරීමේ දැවැන්ත ශක්තියක් එමඟින් අත්පත් කරදෙනු ලබයි.

සමාජ වෘත්තවේදය පිළිබඳ ප්‍රවීණයන් පවසන්නේ කලා කෘතිවල පවතින නෛසර්ගික ගුණයක් වන අන්තර්ගතය හා ආකෘතිය අතර පවතින ආතතිය මඟින් අපගේ කාර්යභාරය පිළිබඳව

අන්තරාවලෝකනය ගොඩනගා ගැනීමටත් අපගේ අත්දැකීම් තවතවත් ගවේෂණය කිරීමටත් එහි ප්‍රතිඵලයක් ලෙස සමාජ වෘත්තවේදය යනු කිමෙක්දැයි නැවත නිර්වචනය කරගැනීමටත් උපකාර වන බවයි. නිර්මාණකරුවකු තම නිර්මාණ ක්‍රියාවලියේ දී මුහුණ දෙන මග හැර යා නොහැකි ගැටලුව නම් තමන්ගේ නිර්මාණ සඳහා සරිලන ආකෘතිය කෙසේ සකසා ගත් යුතු ද යන ගැටලුවයි. මේ පිළිබඳව පවතින එක් මතයක් වන්නේ අන්තර්ගතය මඟින් ආකෘතිය තීරණය කරන බවයි. අන්තර්ගතය විසින් ආකෘතිය තීරණය කෙරේ යැයි පැවැසුව ද නිර්මාණකරුවකු තම නිර්මාණ ක්‍රියාවලිය ආරම්භයේ දී ම මුහුණ දෙන තීරණාත්මක ගැටලුව නම් අන්තර්ගතය ඉදිරිපත් කළ හැක්කේ කෙසේද එයට ගැළපෙන ආකෘතිය කුමක්ද යන්නයි. විවිධ ආකෘති හරහා තම අන්තර්ගතය පෙළගැස්වීමට අරගල කරන නිර්මාණකරුවා යම් මොහොතක තම අත්දැකීමට අනන්‍ය වූ ආකෘතිය සමග සුසංගත වීමට ඉඩ සලසා ගනියි. මේ මොහොතේ ආකෘතියත් අන්තර්ගතයත් එකක්ම බවට පත්වෙයි. එනම් අන්තර්ගතය මඟින් ආකෘතිය පැනවෙන අතර ආකෘතිය මඟින් අන්තර්ගතය පැනවෙයි. මෙය ආකෘතිය සහ අන්තර්ගතය අතර ඇති අන්‍යෝන්‍ය සබඳතාව (symbiotic relationship) ලෙස සැලකෙයි. මෙහිදී තවත් සුවිශේෂී දෙයක් සිදුවේ. එනම් නිර්මාණකරුවා විසින් උපයුක්ත උක්ත ආකෘතිය මඟින් අන්තර්ගතය සහ නිර්මාණ ක්‍රියාවලිය ශික්ෂණයට ලක් කෙරෙන අතරම, තම අත්දැකීම ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය ආකෘතිකමය අත්දැකීම් අත්හදා බැලීම් අනවරතව සංස්කරණය කෙරෙමින් තම මාධ්‍ය ප්‍රතිපෝෂණය කරයි. මෙහිදී ආකෘතික ශිල්ප හරඹ නිර්මාණාත්මක ක්‍රියාවලියක් වන අතර, අන්තර්ගතය තම ගැටලුව හෝ නිර්මාණාත්මක ප්‍රස්තුතය විවිධාකාරයෙන් නිර්වචනය කරයි. හස් ප්‍රකාශ කරන පරිදි කලාව යනු සන්නිවේදන මාධ්‍යයක් බැවින් කලා භාවිතය හරහා සේවාදායකයා සහ වෘත්තවේදියා අතර සන්නිවේදනය වඩා දියුණු තත්ත්වයට පත් කරයි. ඔහුට අනුව අදාළ පුද්ගලයාට කලාව මඟින් තම අත්දැකීම් ප්‍රකාශ කිරීමට සහ ඒවා ඉතා හොඳින් ගවේෂණය කිරීමට ඉඩ ලැබෙයි. මන්ද යත් Figure සහ පසුබිම අතර ඇති ආතතිය මඟින් සේවා යෝජකයාට තම අත්දැකීම් ගවේෂණය කිරීමට ඉඩ ලබාදෙන බැවිනි. මක්නිසාදයත් අත්දැකීම් ඉදිරිපත් කරන්නේ ආකෘතිය සහ අන්තර්ගතය මත වන නිසාය

(Foster 2007; Silver 2001). තම අත්දැකීම් වඩා හොඳින් ගවේෂණය කිරීමට ආකෘතිය සහ අන්තර්ගතය පාවිච්චි කළ යුත්තේ කෙසේදැයි ගවේෂණය කිරීමට ඔවුන්ට සිදුවෙයි. එම ගවේෂණය කිරීම යනු තම අත්දැකීම් වඩා ගැඹුරෙන් ගවේෂණය කිරීමයි.

උක්ත ක්‍රියාවලිය සමාජ වෘත්තවේදය ඇතුළට රැගෙන එන්නේ කෙසේද? එය තම ශික්ෂාව හා කාර්යභාරය අන්තරාවලෝකනය කිරීමටත් අත්දැකීම් ගවේෂණයටත් ශික්ෂාව නැවත නිර්වචනය කිරීමටත් යෙදවෙන්නේ කෙසේද? මෙහිදී සිදුවන ප්‍රමුඛතම කාර්යභාරය නම් යම්කිසි සමාජ හෝ පුද්ගල ගැටලුවකට මැදිහත් වීමට සිදුවන සමාජ වෘත්තවේදියාට අදාළ ගැටලුවට අවශ්‍ය විසඳුම් සෙවීම සඳහා විවිධ එළැඹුම් භාවිත කිරීමට සිදුවීමයි. එහිදී යමෙක් සෞන්දර්ය කලාවන්ගේ පිහිට පතන්නේ නම් සමාජ වෘත්තවේදියාට අදාළ කලා මාධ්‍ය තම ශික්ෂාවෙන් ප්‍රති සකස් කරගැනීමට සිදුවෙයි. මක්නිසාද යත් සමාජ වෘත්තවේදියාගේ කාර්යභාරය කලා නිර්මාණයකට ඔබ්බෙන් ගොස් සමාජ හෝ පුද්ගල ගැටලුවකට ආමන්ත්‍රණය කිරීමක් දක්වා යොමුවන බැවිනි. නමුත් කලාවට සමාජ වෘත්තවේදියකුගේ සහ එය උගෙනගන්නා ශිෂ්‍යයකුගේ අභ්‍යන්තර සංවේදන සහ අත්දැකීම් තමන්ට කැණ බලා තක්සේරු කිරීමට ඉඩ ලබාදිය හැකිය (Kauffman et. al 2011). එබැවින් කලා භාවිතය හරහා සමාජ වෘත්තවේදයේ භාවිත ක්‍රමයක් වෙන විචාරාත්මක අන්තරාවලෝකන භාවිතයෙහි (reflective practice) යන්ත්‍රානුසාරීයව නියැළීම බාධා කරයි.

## සමාජ වෘත්තවේදය තුළ ගැටලු විසඳීමේදී කලාවෙහි වැදගත්කම

හැඳින්වීමේදී ද දක්වන ලද පරිදි ප්‍රශ්න විසඳීම කලාකරුවකුගේ ප්‍රමුඛතම කාර්යභාරය නොවුණ ද එය සමාජ වෘත්තවේදියකුගේ ප්‍රධානතම කාර්යය කාර්යභාරය වෙයි. සමාජ වෘත්තවේදියෙකුගේ ඒකායන අරමුණ අදාළ ගැටලුව හා සම්බන්ධිත පාර්ශ්වවල අත්දැකීම් නිර්මාණාත්මක ක්‍රියාවලියක් ලෙස විකසිත කිරීමයි. මෙම ක්‍රියාවලියේ දී සමාජ වෘත්තවේදියකු මුහුණ දෙන අභියෝගාත්මක කරුණ නම් උපයුක්ත කලා මාධ්‍යයේ සීමා හරහා අදාළ පාර්ශ්වවල

ශික්ෂාවන්ට අනුකූලව ගැටලු ග්‍රහණය කර ගන්නේ සහ ප්‍රකාශයට පත් කරගන්නේ කෙසේද යන්නයි. මෙම ක්‍රියාවලියේදී සමාජ වෘත්තවේදයකු මෙන්ම අදාළ ගැටලුවට මුහුණ දුන් පාර්ශ්වවල අභිමුඛ වන අනෙක් ගැටලුව නම් ගොඩනගනු ලබන ආකෘතික තත්ව යටතේ එයට අනුරූප ලෙස තම ගැටලුව නැවත නිර්වචනය කර ගැනීමයි. මෙලෙස ගැටලුව නැවත නිර්වචනය කිරීම යනු අත්දැකීම් කරා එළැඹීම හෙවත් අන්තරාවලෝකනයට ඉඩ විවර කිරීමක් වන අතර, ඒ මඟින් එක්තරා දුරකට විසඳුම් සෙවීම සඳහා අරගල කරන ගැටලුව ප්‍රති අර්ථකථනය කිරීම හරහා එය වඩා පැහැදිලි කර ගැනීමක් මෙන්ම චිත්ත ශෝධනයක් (catharsis) ඇති වීමටත්, එයට හේතුකාරක වූ අත්දැකීම් ගවේෂණය කිරීම හරහා චිරස්ථායී විසඳුම් ගොඩනගා ගැනීමටත් උපකාර වේ.

මේ ආකාරයටම සමාජ වෘත්තවේදය හෝ කලා නිර්මාණ භාවිත කිරීම හරහා තම විෂය ක්ෂේත්‍රය පුළුල් ලෙස නිර්වචනය කිරීමට ඉඩප්‍රස්තාව උදා කර ගනී. එක් අතකින් එය පවතින වාස්තවික (objective) හෝ යථානුභූතවාදී (positivist) නිර්වචනවලින් ඔබ්බට ගොස් වඩා පරිකල්පනීය ලෙසත් නිර්මාණශීලී ලෙසත් විෂය ප්‍රති අර්ථ කථනයකට අවශ්‍ය ඉඩප්‍රස්තාව උදා කර ගනී. ඇතැම් කලාවන් මූලික කරගත් ක්‍රමවේද එවන් අන්තර්ඥාන ගවේෂණවලට බාධා කරන මූලික මට්ටමේ න්‍යාය ගැන්වීම්වලට ප්‍රතිරෝධය දක්වන අතරම පරිකල්පනීය භාවිත මඟින් සැලකිය යුතු මට්ටමේ විචාරාත්මක අවලෝකනවලටත්, එමඟින් ගැටලු ගැඹුරු ලෙස තේරුම් ගැනීමටත් අවශ්‍ය මාවතක් සපයා දෙයි (Walton, 2012). සමාජ වෘත්තවේදියෙක් තම සේවාදායකයාගේ අත්දැකීම් වඩා උචිත ලෙසත් නිර්මාණශීලී ලෙසත් නිර්වචනය කිරීම සහ ප්‍රකාශයට පත් කිරීමේ ආකෘතික සොයා බැලීම්වලට යොමු වේ. මෙම යොමු වීම සහ එම භාවිතාව පරිධිය පුළුල් කිරීමේ මාර්ගයකි.

සෞන්දර්ය කලා විධික්‍රමික ප්‍රවේශයක් ලෙසට භාවිතයට ගැනීම හරහා පුද්ගලයන් අභ්‍යන්තරිකවත් සමාජීය වශයෙනුත් වෙනසකට ලක් කිරීමේ හැකියාවක් ඇති බව පිළිගත් කරුණකි (Bos & Huss, 2019). ප්‍රථමයෙන් සඳහන් කළ පරිදි සෞන්දර්ය කලා මාධ්‍යය සතුව පවතින නිර්මාණශීලී මෙන්ම සංවේදනාත්මක ගුණය නිසා විවිධ ගැටලුවලට ලක්වූ පුද්ගලයන්ට තම ගැටලුව පුළුල් ලෙස නිර්වචනය කර ගැනීමට

යාමේදී එමගින් සිදුවන අභියෝගාත්මක ක්‍රියාවලිය හේතු කොට ගෙන ඉතා සවිඥානික ලෙස අභ්‍යන්තරික තත්ත්ව පරිවර්තනය කර ගැනීමේ ගුණය අත්පත් කරගැනේ. එය ආයතනගත, යාන්ත්‍රික සහ වාස්තවික ක්‍රියාවලි හරහා බාහිරව කෙරෙනු ලබන උත්තේජනයකට වඩා ස්ථිර ලෙස ප්‍රතිඵල අත්පත් කර ගැනීමේ මාදිලියකි. මෙහිදී විසඳුම් ගවේෂණය කිරීම මෙන්ම ස්වයං යෝජනාත්මක ශක්‍යතාව ද පුද්ගලයා අත්පත් කර ගනී. එසේම කලා කටයුතු පොදු මහජන අවකාශයේ ක්‍රියාත්මක කෙරෙන බැවින් එහිදී සමස්ත හෝ යෝජිත සමාජ අවකාශයම ගැටලු විසඳීමේ ක්‍රියාවලියට සම්බන්ධ කරගැනීමට ආරාධනා කෙරෙන අතරම එමගින් සමස්තයක් ලෙසට සමාජ ක්‍රමයම පරිවර්තනය කිරීමේ ගුණය අත්පත් කරගනී. අනෙක් අතට එය පුද්ගල සහ මහජන අවකාශය අතර ගොඩ ගොඩනැගුණු පාලමක් බැවින් ගැටලු විසඳීමේ ක්‍රියාවලිය කේවල හෝ හුදෙකලා කණ්ඩායම්වලට වෙන්වූ ක්‍රියාවලියක් පමණක් නොවන බව පෙනී යනු ඇත.

උදාහරණයක් ලෙසට ලිංගික අපයෝජනයකට ලක්වූ කාන්තාවකගේ අත්දැකීම් සලකා බැලීමේ දී දැඩි ක්ෂතිමය තත්ත්වයකට පත්වූ කාන්තාවක තම ජීවිතයේ දිශානතිය අහිමි කර ගන්නවා පමණක් නොව ජීවිතය අහිමි කර ගැනීමේ තත්ත්වයකට පවා යොමුවීමට ඉඩ තිබේ. මෙයට එක් හේතුවක් නම් ඇය ලිංගිකව අපයෝජනයකට ලක්වීමට පමණක් සීමා නොවී ඇය හා සමස්ත සමාජය අතර සිදුවන සමාජ අන්තර් ක්‍රියාවන්ගේ පීඩාකාරී ස්වභාවය ද විය හැකියි. වින්දිතයාට දෝෂාරෝපණය එල්ල කෙරෙන, ඇය රැකබලා ගැනීම පිණිස සමාජ ආයතන පද්ධතියක් හෝ නීති රාමුවක් මෙන්ම ආගම හෝ වෙනත් ඕනෑම කරුණක් මත පදනම් වූ අගය පද්ධතියක් නොමැති සමාජයක සුරක්ෂිත බව පිළිබඳව සත්තාමය අත්දැකීම් තුළ ගිලී යාමට ඉඩ තිබේ. මෙවන් මොහොතක දී තම ගැටලුවෙන් මිදීමට හෝ ජීවිතය ගොඩනගා ගැනීමට මාවතක් නොදකින ඇය ජීවත් වීමේ තේරුම කුමක්දැයි යන සත්තවාදී (existential) පැනය විමසයි. එහි අවසන් ප්‍රතිඵලය විය හැක්කේ සිය දිවි නසා ගැනීමයි. මෙවන් මොහොතක ආයතනික පද්ධතියකට යම් මැදිහත්වීමක් කිරීමට හැකියාව පැවතිය ද ගිලිහී ගිය පුද්ගල දිශානතිය ගොඩ ගොඩනගා දීමට එය එතරම් ප්‍රමාණවත් නොවීමට ඉඩ තිබේ. මන්ද යත් එය අභ්‍යන්තරිකව සිදුවිය යුතු වෙනසක් බැවිනි. මෙවන්

අවස්ථාවක පුද්ගල දක්ෂතාව සහිත සමාජ වෘත්තවේදියකු ඇය සහ ඇය නියෝජනය කෙරෙන සමාජ කණ්ඩායමම අන්තර්කරණය කරගත හැකි පරිදි කලා මාධ්‍ය විධික්‍රමයක් ලෙසට භාවිතයට ගන්නේ නම් ජීවත් වීමේ අර්ථ සොයා පාදා දීමට ඉඩ සැලසෙනවා පමණක් නොව තම අත්දැකීම් විදාරණය කර ගැනීම මඟින් අභ්‍යන්තරිකව වෙනස් වීමේ ජීව ගුණය ද ලබා දෙයි. එමතු ද නොව කලාව සමාජය සමඟ යෙදෙන සංවාදයේ ප්‍රතිඵලයක් ලෙසට සමාජ පුද්ගල කණ්ඩායම්වලට තම ප්‍රචණ්ඩකාරීත්වය තේරුම් ගැනීමටත්, ඒ පිළිබඳව තාර්කිකව විමසා බලා තමාවම වෙනස් කර ගැනීමටත් අවශ්‍ය පිටිබලය ලබා දෙයි. එය කලාව සතු මහජන මතයට බලපෑම් කිරීමේ ශක්‍යතාවයි.

සමාජ වෘත්තවේදියකුට වෘත්තීයමය අවකාශ ඇතුළත වැඩ කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණක් ලෙස වැඩ කරන ස්ථානය සහ එහි ඇති බල සබඳතා සැලකිය හැකිය (Barlow & Hall 2007; Carpenter & Webb 2012). එවන් අවස්ථාවක ඇතිවෙන ගැටලුවලදී සමාජ වෘත්තවේදියා, සේවාලාභියා සහ ප්‍රතිපත්ති සම්පාදකයා යන ත්‍රිත්වයම සාකච්ඡාවේ මතුවෙන බල තුලනය කිරීම නිර්මාණශීලීව කිරීම සඳහා කලාව භාවිත කිරීම වඩා විපුලදායක වේ (Huss). සමාජය යනු ගතික ප්‍රවාහයකි. එහි ඇති ආනුෂංගික කොටස් ලෙස සැලකෙන පුද්ගලයා, සමාජය, සංස්ථා සහ ආයතන යන සමස්ත සමාජ පරිසරයම අනවරත වෙනස්වීමේ ක්‍රියාවලියකට ලක් වෙමින් පවතී. එවන් වූ සමාජයක ගැටලු තේරුම් ගැනීමට නම් එම සමාජ ව්‍යූහය සහ සමස්ත සමාජ සන්දර්භය ම තේරුම් ගැනීමටත් ඒවා වෙනස් කිරීමටත් හැකිවිය යුතු වෙයි. එය කළ හැක්කේ අදාළ සමාජ ක්‍රියාවලි සහ එම සන්දර්භ විසින් ගොඩනැගෙන අර්ථ තේරුම් ගැනීම මඟින් පමණකි. සමාජ වෘත්තවේදීන් (Aenheim, 1996) පෙන්වා දෙන ආකාරයට සෞන්දර්ය කලා මාධ්‍යයන්ට මෙම ගතික සමාජ සන්දර්භවල අර්ථ සම්පාදනය කර ගැනීමටත් ඒවා වෙනස් කිරීමටත් හැකියාව පවතින අතරම ඒ හේතු කොටගෙන සමාජ වෘත්තවේදය ප්‍රායෝගික ශික්ෂාවක් ලෙස යාවත්කාලීන කිරීමේ හැකියාවක් පවතින බවත් පෙන්වා දෙයි. පෙර සඳහන් කළ ආකාරයට කලාවට සමාජ වෘත්තවේදී දැනුමේ සාර්ව සහ ක්ෂුද්‍ර මට්ටම තුළදී සමාජ වෘත්තවේදියා සහ සේවාදායකයා අතරත් චිත්තවේග සහ ප්‍රජානක තලයත් එකිනෙකට සම්බන්ධ කළ හැකිවෙයි (Huss, 2017).

එපමණක් නොව මනෝ සමාජීය තලයේදී ගැටුම් වැනි අවස්ථා සංකේතාත්මකව ප්‍රතිනිර්මාණය කිරීම හරහා ගැටුම් නිෂ්ක්‍රිය කිරීමේ හෝ ඒවා අවම කර ගැනීමේ හැකියාවක් ගොඩනඟා ගනියි. සමාජ ආතතිය මුදා හැරීම් සඳහා යාතුකර්ම පැනවීම් මානව අත්දැකීමකි. Franz Fanon (1963) පෙන්වා දෙන පරිදි අප්‍රිකානු සමාජ ගෝත්‍ර අතර සිදුවන ගැටුම් අවම කර ගැනීමේ සහ ලිබිඩෝ ශක්තිය පාලනය කර ගැනීමේ මාවතක් ලෙසට නර්තනය පවත්වා ගෙන ගිය බවත්, යටත්විජිත අවදියේ දී එම නර්තන ආදි යාතුකර්ම පැවැත්වීම තහනම් කිරීම හේතුකොටගෙන එය ප්‍රචණ්ඩත්වයට මාරුවූ ආකාරයත් පෙන්වා දෙයි. ඊදමරාසැම පෙන්වා දෙන ආකාරයට මෙලෙස ගැටුම් අවම කර ගැනීමේ ශක්‍යතාව ක්‍රීඩාව අත්පත් කර ගනී. මෙම මානව අත්දැකීම් ත්‍රිත්වය මඟින් ප්‍රකාශ වන්නේ එක් පොදු කරුණකි. එනම් ගැටුම් කළමනාකරණය කිරීම් පිණිස විවිධ සමාජවල විවිධ යුගවල දී මිනිසා විසින් ගොඩනඟා ගන්නා ලද මානව ක්‍රියාකාරකම්වල පොදු ගුණයයි. මෙම මානව අත්දැකීම් යාතුකර්ම සහ ක්‍රීඩාවේ සිදුවන්නේ ගැටුම් සංකේතාත්මකව ප්‍රතිනිර්මාණය කිරීම සහ මුදා හැරීම මඟින් සමාජ ආතතිය මුදා හැරීමයි. ඒ අතින් ගත් කල එය සුවිශිෂ්ට ලෙස ප්‍රතිනිර්මාණය කිරීමේ, සංකේතාත්මකව ප්‍රකාශ කිරීමේ හැකියාව කලාව සතුව පවතී. එහිදී සෞන්දර්ය කලාවන්ට ආකාර දෙකකින් ක්‍රියාත්මක වීමේ හැකියාව පවතියි. පළමුවැන්න සංකේතාත්මක සහ චිත්තවේගීය තලය ආඛ්‍යානගත කිරීමයි. දෙවනුව ගැටලුවට මැදි වුණු පාර්ශ්ව හරහා සාධාරණ ලෙස එම ගැටුම් විශ්ලේෂණය වන ආකාරයට ආඛ්‍යානවල ගැටීමයි. මේ මඟින් එකිනෙකා එකිනෙකාට සමාව දීම සහ ඔවුන් තේරුම් ගැනීමේ මාවතක් ගොඩනඟා ගැනීමට හැකියාව ලැබෙයි.

තිස් වසරක් සිවිල් යුද්ධයක් පැවැත්වුණු අවස්ථාවේදී ගැටුම් කළමනාකරණය කිරීමේ සංවිධාන සහ ආධාර කණ්ඩායම් කලාව මූලික කර ගත් මෙවන් වැඩමුළු හෝ සෞන්දර්ය ක්‍රියාකාරකම් සිය ගණනින් ලංකාව පුරා පැවැත්වූ අතර, එය සාර්ථක ප්‍රවේශයක් බව බොහෝ අය පිළිගත්හ. එහෙත් මෙම වැඩමුළු සහ කලා ව්‍යාපෘතිවල පුහුණුවලත් සමාජ වෘත්තවේදීන් සහ අදාළ පාර්ශ්ව කණ්ඩායම් කොතෙක් දුරට සහභාගි වූයේ දැයි ගැටලුවක් පවතියි. නියමාකාරයෙන් නම් විය යුත්තේ අදාළ ව්‍යාපෘති සැලසුම් කිරීම නමැති ක්‍රියාවලියේදී සමාජ

වෘත්තවේදීන්ගේ දායකත්වය මත එම වැඩසටහන් ප්‍රති නිර්මාණය වීමයි. මෙහි තර්කය නම් මූලික රාමුව සහ අරමුණු තෝරා ගත් පරිදි අදාළ වැඩසටහන ගොඩනැංවීම සමාජ වෘත්තවේදින්ගේ විශේෂ ප්‍රාගුණ්‍යය මත, ගැටුම්වලට කේන්ද්‍රීය කණ්ඩායම් මැදිහත් කරගෙන සිදුවිය යුතු බවයි. එහෙත් විශ්ලේෂණාත්මක තලයේ දී අපට පෙනී ගියේ ගැටුම් නිරාකරණය වැනි සමාජ න්‍යායන් සහ වැඩසටහන් අතර ප්‍රතිරෝධයක් හෝ ආතතියක් හෝ මතුවීමයි.

එසේම සමාජ වෘත්තවේදීන් තර්ක කරන්නේ කලාව මඟින් පුද්ගලයාගේ විෂය මූලික දැනුමත් සමාජය පිළිබඳ වාස්තවික දැනුමත් එකට යා කරන පාලමක් ලෙස ක්‍රියා කරන බැවින් ගැටලු විසඳීම සඳහා එය මහඟු උපකාරයක් වන බවයි (Csikszentmihalyi, 1990; Zelizer, 2003). කලා කෘතියක් නිර්මාණය කිරීම යනු කලාකරුවාගේ නැතහොත් නිර්මාණකරුවාගේ අත්දැකීම් සහ ඔහුට පරිබාහිරව ඇති සමාජීය දැනුම් සුසංගත වීමකි. ඒ ඔහු සැමවිටම තමාට පරිබාහිර වාස්තවික ලෝකය තම කලා නිර්මාණ උදෙසා සංජානනය කරගන්නා හෝ අනුභූති කරගන්නා බැවිනි. එම වාස්තවික ලෝකය අන්තර්කරණය කරගන්නා නිර්මාණකරුවා එය පුද්ගල සංවේදනාවක් බවට පත්කර ගනියි. අප අමතක නොකළ යුතු දෙය නම් අපේ පැවැත්ම වනාහි මෙම අභ්‍යන්තරික ලෝකය සහ බාහිර ලෝකයේ සුසංගත භාවය හෙවත් වෛෂයිකත්වයයි (intersujective). එබැවින් කලාකරුවාගේ නිර්මාණයක් යනු මෙම වාස්තවික ලෝකය පිළිබඳ පුද්ගල අත්දැකීම් නැවත පොදු වාස්තවික අත්දැකීමක් බවට පත්කර බෙදා-හදා ගැනීමේ ක්‍රියාවලියයි. කලාව සමාජ ගැටලු විසඳීමේදී සමාජ වෘත්තවේදය තුළ ප්‍රබල අවියක් වන්නේ මෙම ගැටලුකාරී අත්දැකීම් බෙදා-හදා ගැනීමට අවැසි අවකාශය එමඟින් තනා දෙන බැවිනි.

පුද්ගලයෙකුට ඇති වන ගැටලුවක් සැමවිටම පුද්ගල ගැටලුවක් පමණක්ම නොවන බව අප දන්නා කරුණකි. අති පෞද්ගලික ගැටලු ලෙස පෙනෙන ප්‍රශ්නවල මූලය වාස්තවික ලෝකය බව සියුම් නිරීක්ෂණවලින් අපට පෙනෙනු ඇත. එනමුදු මෙම සමාජ මූලයන්ගෙන් පැන නඟින ගැටලු අවසානයේ පුද්ගල කේන්ද්‍රීය විඳවීම් බවට පත්වෙයි. අනෙක් අතට මෙහි බලපෑම් පෙරළා සමාජය කරා පැමිණෙන අයුරු දකින්නට අපට පිළිවන. එබැවින් මෙම ගැටලුවලට, අවනඩුවලට ආමන්ත්‍රණය කිරීමේදී සිදුවිය යුතු අත්‍යවශ්‍ය දෙයක්

නම් ගැටලු සම්බන්ධයෙන් ඒ ඒ පුද්ගලයන්ගේ විෂය මූලික දැනුමත් සමාජීය හෙවත් වාස්තවික දැනුමත් අතර පවතින පරතරය නිරීක්ෂණය කිරීමයි. සමාජ වෘත්තවේදයේ මේ සඳහා එළැඹුම් පැවතියේ වුවද පුද්ගල සංවේදනාවලට ආමන්ත්‍රණය කිරීමේදී ඒ සඳහා පහසුවෙන් ප්‍රවිෂ්ට වීමට මෙන්ම එම ගැටලු තේරුම් කරගැනීමට අවශ්‍ය අවකාශය කලාව මඟින් ලබා දෙයි. Arnheim (1996) උපුටා දක්වමින් Huss පවසන්නේ කලාවෙන් විචාරාත්මක චින්තනයට ඉඩ සැලසෙන්නේ එමඟින් බහුවිධ අර්ථකථන සම්පාදනය කරන බැවිනි. මක්නිසාද යත් කලාකෘතියක් කිසිදු දිනෙක තනි අර්ථ සම්පාදනය නොකරන බැවිනි. කලා ක්‍රියාකාරකම්වලදී ගැටලුවේ බහුවිධ මාන තේරුම් ගැනීමට මෙන්ම බාහිර ලෝකයට ඒ සඳහා සංවේදී අයුරින් සම්බන්ධවීමට අවකාශ සලසන බැවින් එය ගැටලු විසඳීමට උපකාරී වන බව පිළිගත් මතයයි.

පුද්ගල හෝ සමාජ ගැටලු අවබෝධ කරගැනීමේදී, විශ්ලේෂණය කිරීමේ දී සහ එයට පිළිතුරු සැපයීමේ දී මතුවන පොදු ගැටලුවක් නම් එම ක්‍රියාවලිය හුදු කේවල න්‍යාය පථ මත රඳා පැවතීමයි. මෙය බොහෝවිට සිදුවන්නේ සමාජ සමාජ වෘත්තවේදීන්ගේ පුහුණුව, නිපුණත්වය සහ ආයතනික රටාව එම ක්‍රියාවලිය මත්තෙහි පවත්වන ආධිපත්‍යය මතයි. Nahri (2001)ට අනුව සමාජ වෘත්තවේදියකුට තම අර්ථ ඥානය මත පදනම් වූ දැනුම භාවිත කිරීම මඟ හරවන ප්‍රධාන දේ නම් ඒ විෂයය පථය ඇතුළත ඇති ආධිපත්‍යධාරී මතවාද සහ අන්ධානුකරණයෙන් භාවිත න්‍යාය හෝ අභ්‍යන්තර අත්දැකීම් ඇගයුම් කිරීමේ ශක්‍යතාව මඟ හරවන කළමනාකාරී මනසින් යුත් ක්‍රියාව පදනම් කරගත් අධීක්ෂණ වේ. පුද්ගල හෝ සමාජ ගැටලුවක් තේරුම් ගැනීමට අප භාවිත කරන න්‍යායික ප්‍රවේශය අපට එය දැක ගැනීමට අවශ්‍ය ආකාරයට ම පමණක් පෙන්නුම් කරයි. නැතහොත් එම ගැටලුවට බලපානු ලබන හෝ එය විසඳිය හැකි බහුවිධ මූල නොපෙන්වයි. උදාහරණයක් ලෙසට යම් ගැටලුවක් සඳහා හේතු කාරක වන්නේ පුද්ගල මනෝමූල තත්ත්වයක් පමණක් ම නොවේ. ඒ සඳහා සමාජ ආර්ථික මෙන්ම සංස්කෘතික තත්ත්ව ද බලපායි. මේ එක් සාධකයක් පමණක් සැලකුව ද ඒ මත තත්ත්වය තේරුම් ගැනීමට පමණක්ම බහුත්ව න්‍යායන් පවතින බව බොහෝ විට අපට පෙනී යනු ඇත.

මේ සඳහා බලපාන තවත් එක් හේතුවක් නම් න්‍යායාත්මක සහ ක්‍රමවේදීය ධාරාවල පවතින සීමාසහිතකම් නිසා බහුවිධ න්‍යායාත්මක සහ ක්‍රමවේදීය තල සුසංගත වීම වළක්වා ලීමයි. එහෙත් මේ ගැටලුව විසඳීම සඳහා ඇති සාර්ථක ප්‍රවේශයක් නම් කලා මාධ්‍ය භාවිත කිරීමයි. පර්යේෂකයන් පෙන්වා දෙන ආකාරයට බහුවිධ න්‍යාය පථ දරාගෙන සිටීමේ හැකියාව කලා මාධ්‍ය සතුව පවතින බැවින් සමාජ ක්‍රමයන්ට අනුව එම ගැටලු විසඳීමට එයට හැකියාවක් ඇත. මෙය ආකාර දෙකකින් සිදු විය හැකිය. පළමුව ගැටලු විශ්ලේෂණයේදී සහ ඒවාට විසඳුම් සෙවීමේදී සමාජ වෘත්තවේදයකුට කලාව හරහා එම ගැටලුව බහුවිධ ආකාරයකට නැතහොත් බහුවිධ දෘෂ්ටිවලට අනුව විශ්ලේෂණය කිරීම සඳහා අදාළ පාර්ශ්වකරුවන්ට ආරාධනා කිරීමයි. දෙවනුව එම ගැටලුව බහුවිධ ආකාරයෙන් අර්ථකථනය කර ගැනීම සඳහා මෙන්ම තේරුම් කරගැනීමට අදාළ පාර්ශ්වකරුවන් දායක කර ගැනීමයි. කලාව මඟින් විචාරාත්මක ගුණය වර්ධනය කරන්නේ බහුවිධ අර්ථකථනවලට විවර වනවාක් මෙන්ම ප්‍රජානක තත්ත්ව, චිත්තවේග සහ සංවේදන අන්තර් ග්‍රහණයට ඉඩ සලසා දෙන බැවිනි (Walton, 2012, Huss, 2018).

මෙහිදී සමාජ වෘත්තවේදීන් සහ අදාළ පාර්ශ්වකරුවන් නිරත වන කලා මාධ්‍ය මඟින් පාර්ශ්ව දෙක අතර ඇති දුරස්ථභාවය කඩා බිඳ දමන අතරම එම පාර්ශ්ව දෙකටම තේරුම් ගැනීමට හැකි පොදු භාෂාවක් භාවිත කිරීම හරහා පොදු තලයකදී විවිධ න්‍යායික දෘෂ්ටිකෝණ හා ප්‍රවේශ මඟින් එම ක්‍රියාවලියට සහභාගි වීමට ඉඩ ලැබේ. එබැවින් කලා භාවිතය මඟින් සමාජ වෘත්තවේදය ඇතුළත ගැටලු විසඳීමේදී විවිධ න්‍යායික දෘෂ්ටිපථ එකට දරා ගෙන සිටීමේ හැකියාවක් පවතින බවට විශ්වාස කෙරේ. මේ අනුව සලකා බලන විට කලා සෞන්දර්ය කටයුතු භාවිත කිරීම ඔස්සේ සමාජ වෘත්තවේදයෙහි පුද්ගල සහ සමාජ ගැටලු විසඳීමේ අඩවිය පුළුල් කර ගැනීමට විවිධාකාරයේ අවකාශ සලසා දෙන බව පෙනේ. එය පරිකල්පනීය විස්තරවලට ඉඩ දෙන අතරම පුද්ගලයන්ට තම සන්දර්භයේම ස්ථානගත වෙමින් තමන්ව ම අර්ථකථනය කරගැනීමට ඉඩ ලබා දෙයි (Huss, 2018).

අප විමසිය යුතු ගැටලුව නම් පුද්ගල සහ ප්‍රජා සුභසාධනය වර්ධනය කිරීමටත් බලාත්මක කිරීමටත් කලාව මූලික කරගත් මැදිහත්

වීම් කෙරෙන්නේ කුමන ආකාරයකටද යන්නයි? මේ සඳහා භාවිත කරන එක් එළැඹුමක් නම් ධනාත්මක මනෝ විද්‍යාත්මක එළැඹුම්ය. ධනාත්මක මනෝවිද්‍යාත්මක ලාක්ෂණිකයන් යනු අයහපත් මනෝ ලක්ෂණවලට ප්‍රතිවිරුද්ධ තත්ත්වයන්ය. මෙහිදී අසන්තුෂ්ටියට ප්‍රතිපක්ෂව සන්තුෂ්ටිය, අප්‍රසන්න හැඟීම්වලට එරෙහිව ප්‍රසන්න හැඟීම් ද සැලකිය හැකිය. ඍණාත්මක මනෝවිද්‍යාත්මක ලාක්ෂණිකයන් ඔස්සේ සිදුවන්නේ යමකුගේ සමස්ත මනෝදේහික ක්‍රියාවලියට බාධා පමුණුවමින් පැවැත්ම පිළිබඳ අර්බුදයක් මතු කිරීමයි. උදාහරණයක් ලෙසට යම් අත්දැකීමක් පාදක කරගනිමින් කලකිරීමට පත් වූ අයකු ඒ පිළිබඳව නිරතුරුව සිතීම හරහා විශාදයට ගොදුරු වීමට ඉඩ ඇති අතර, ඇතැම් විට තම පැවැත්ම අවසන් කර ගැනීමේ තීරණයකට එළැඹීමට ද ඉඩ ඇත. එබැවින් සමාජ වෘත්තවේදය ඇතුළත සිදුවන එක් කර්තව්‍යයක් නම් අයහපත් මනෝ සමාජීය ලාක්ෂණිකයන්ට ප්‍රතිපක්ෂව ඇති ලක්ෂණ තහවුරු කිරීම සඳහා කටයුතු කිරීමයි. සාමූහිකව කෙරෙන කලා කටයුතු මඟින් ප්‍රතික්ෂේපිත පුද්ගලයකු අන්තර්කරණය කරගැනීමටත්, ධනාත්මක චිත්තවේගයක් වර්ධනය කර ගැනීමටත් ඉඩකඩ ලැබේ. මේ මඟින් පුද්ගලයාගේ යහපැවැත්ම තහවුරු කිරීමේ හැකියාව ලැබේ. Lyubomirsky (2008) මෙම මනෝ ලාක්ෂණිකයන් කොටස් 2කට වර්ග කරයිඃ

1. ජීවන තත්ත්ව (life conditions) (මේ යටතට වයස, ලිංගිකත්වය, වාර්ගිකත්වය වැනි සාධක ඇතුළත් වෙයි.)
2. ස්වේච්ඡාමය ක්‍රියාකාරකම් (voluntary acts) (මේ යටතට ස්වකැමැත්තෙන් කරන කටයුතු ගැනෙයි.)

උදාහරණයක් ලෙසට ඡායාරූප කලාව, චිත්‍ර කලාව, නව භාෂා ඉගෙනගැනීම, කාව්‍යකරණය ආදි නිර්මාණාත්මක පක්ෂයට අයත් කටයුතු ගැනෙයි. සමාජ වෘත්තවේදීන් පෙන්වා දෙන්නේ මෙම ස්වකැමැත්තෙන් කෙරෙන කටයුතු මඟින් පුද්ගල ජීවිතයේ අවස්ථා වෙනස් කරගැනීමට හැකියාවක් පවතින බවයි. මේ මඟින් පුද්ගලත්වය ඉහළටම ඔසවා තැබීම, යහපත් හා තෘප්තිමත් සිතිවිලි වර්ධනය කර ගැනීම, සහ විශාදය වැනි මානසික ව්‍යාධිවලින් පෙළෙන පුද්ගලයකුට තම පරිසරයට නිරාවරණය වීමේ අවස්ථා වැනි තත්ත්ව ළඟා කරගත හැකි බව පෙන්වා දෙයි.

මීළඟට ගැටලුව නම් කලාව සහ සෞන්දර්ය මූලික කරගත් ක්‍රියාකාරකම් කෙසේ, කුමන සන්දර්භයකදී සමාජ වෘත්තවේදය සමඟ බද්ධ කළ යුතුද යන්නයි. එය තීරණය වන්නේ අදාළ සමාජ ගැටලුව සහ එහි ස්වරූපයත් එම ගැටලුව ආමන්ත්‍රණය කිරීමට උචිත කලා මාධ්‍යයන්ගේ ස්වභාවයත් අනුවයි. මක්නිසාදයත් ඕනෑම කලා මාධ්‍යයක්, ඕනෑම ගැටලුවක් ආමන්ත්‍රණය කිරීමට උචිත නැත; ඒ ඒ කලා මාධ්‍යවල ස්වරූපය අනුව ජනනය විය හැකි ප්‍රතිඵල විවිධ විය හැකි බැවිනි. මෙහි මූලික තර්කය නම් සියලු කලා සහ සෞන්දර්ය කටයුතු යහපත් ධනාත්මක චිත්තවේග සහ ප්‍රතිඵල ජනනය කිරීමේ විශ්වීය ගුණයක් අත්පත් කරගත්ත ද ඒ ඒ කලා මාධ්‍යයන්ගේ ප්‍රකාශන මාදිලිය සහ ඒවා ක්‍රියාත්මක වන්නා වූ ස්වභාවයේ ගතිකත්වයක් පවතින බවයි. උදාහරණයක් ලෙස කවිය වැනි මාධ්‍යයක් ගත් විට එය බොහෝවිට කේවල මාධ්‍යයක් සේ නැඟී සිටිය ද, කාව්‍යකරණය කේවල මාධ්‍යයක් සේ පෙනුණ ද එය ක්‍රියාත්මක කිරීමට සාමූහික ශ්‍රමයක් අවශ්‍ය වෙයි (Becker, 2008). යම් මානසික ව්‍යාකූලතාවකින් පෙළෙන අයකුට තම මානසික පීඩනය මුදා හැරීමේ මාර්ගයක් ලෙසට කවි හා බැඳීමට උනන්දු කළ ද ඒ අය ප්‍රකාශනයක් දක්වා දක්වා රැගෙන යන්නේ නම් ඒ සඳහා අනුබල දීමට අමතරව අවශ්‍ය අමුද්‍රව්‍ය සම්පාදනය, ප්‍රකාශකයන් සොයා යෑම, කවි ගායනය වැනි කුඩු මහත් කටයුතු රාශියකට සාමූහික ශ්‍රමයක් සහභාගි කර ගැනීමට සිදුවිය හැකිය. සාපේක්ෂ වශයෙන් ගත් කල කාව්‍යකරණය සහ රසවින්දනය, කෙටිකතා හෝ නවකතාකරණය හෝ රසවින්දනය වැනි සෞන්දර්ය ක්‍රියාකාරකම් ගීතය, සංධ්වනි, ඔපෙරා වැනි සෞන්දර්ය ක්‍රියාකාරකම්වලට වඩා අඩු මූල්‍යමය පිරිවැයක් ඉල්ලා සිටින අතර, චිත්තවේග මුදා හැරීම වැනි කරුණකදී එය අනෙක් නිර්මාණවලට වඩා සාපේක්ෂ වැඩි ඉඩක් ලබා දෙයි. අනෙක් අතට ගීත නිර්මාණය, සිනමාව, සංධ්වනි, ඔපෙරා, නාට්‍යකරණය වැනි කලා මාධ්‍ය ක්‍රියාත්මක වන්නේ මීට ඉඳුරාම වෙනස් ආකාරයකටය. ඒවා සාමූහිකත්වය රජයන ක්ෂේත්‍ර වේ. එවැනි මාධ්‍ය විශාල මූල්‍ය පිරිවැයක් ඉල්ලා සිටින නමුත් ඒ හා සමානවම ශ්‍රම දායකත්වයක් ද ඉල්ලා සිටී. එබැවින් විශාදය හෝ වෙනයම් මානසික සංකූලතාවලින් පෙළෙන පුද්ගලයන්ට හුදෙකලාව වැනි තත්ත්වලින් මිදීමට අවශ්‍ය පරිසරයක් තනා දී, එසේම ස්වයං තීරණ ගැනීමේ ක්‍රියාවලියට ප්‍රතිපක්ෂව බහුවිධ

පර්යාලෝකවලින් පෝෂණය සහ ආලෝකය ලැබීමේ මාවතක් විවර කර දෙයි.

මේ සියල්ලෙන් පැහැදිලි වන දෙයක් තිබේ. එනම් ඒ ඒ කලා නිර්මාණ ක්ෂේත්‍ර මඟින් ඉල්ලා සිටින මානසික සහ කායික සහ සම්බන්ධතාව පුද්ගලයකුගේ මානසික සහ කායික සමබරතාව පවත්වාගෙන යාමට දැඩි රුකුලක් වන බවයි. ගැටලුව නම් පෙර සඳහන් කළ ආකාරයට මේ සෑම කලා මාධ්‍යයක්ම සෑම සමාජ ප්‍රශ්නයක්ම ආමන්ත්‍රණය කිරීමට යොදාගත නොහැකි වීමයි. කාංසාව හා ආතතිය වැනි මන්ද මානසික සංකුලතාවලින් පෙළෙන අයට හෝ මන්ද මානසික මානසිකත්වයෙන් පෙළෙන අයෙකුට, මෙන්ම සමාජ බලය අහිමි වූවන් බලගතු කිරීමට අවශ්‍ය මෘදු කුසලතා වර්ධනය කිරීමට ඉහත කලා මාධ්‍ය යෝග්‍ය වුවද මන්ද මානසිකත්වයෙන් පෙළෙන අයෙකුට නිර්මාණාත්මක රචනය යෝග්‍ය නොවේ. එසේම විවිධ අංගවිකල බවෙන් පෙළෙන අයට නිර්මාණාත්මක රචනය යෝග්‍ය වුව ද ඉහත දැක්වූ ප්‍රාසාංගික කලා මාධ්‍ය උචිත නොවිය හැකිය. මන්දයත් එම කලා මාධ්‍යවල නිරත වීමට අවශ්‍ය කායික බලය ඔවුන්ට නොමැති බැවිනි. එසේම සමාජ සංස්කෘතික සහ ආර්ථික වශයෙන් බහිෂ්කරණයට ලක්වූවන්ට, සමාජයේ අනෙක් ආන්තික කණ්ඩායම්වලට ඉහත කී ඕනෑම කලා මාධ්‍යයක නිරත වීමේ හැකියාව පැවතීමට ඉඩ ඇත. එබැවින් මෙවැනි කලා මාධ්‍ය සමාජ වෘත්තවේදය ඇතුළට රැගෙන ඒම මඟින් අදාළ ගැටලුවලට ගොදුරුවූවන්ට එම ගැටලුවලින් මිදීම සඳහා අවශ්‍ය කරන සුවිශේෂී වූ චිත්තවේග දැල්වීමේ හැකියාව පවතී. එසේම එම මාධ්‍යයන්ගේ පවතින සුවිශේෂී ගුණ නිසා වාචික මාධ්‍යවලින් ඔබ්බට ගොස් ක්‍රියාත්මක වීමේ හැකියාව පවතී. ශරීරය ප්‍රකාශන උපකරණයක් ලෙස භාවිත කිරීම ඔස්සේ සන්නිවේදනයට ඇති විවිධ බාධා බිඳ දැමීමට හැකි අතර, පවතින යථාර්ථයට ඔබ්බෙන් වූ අවකාශ ගොඩනැඟීමේ හැකියාව ද පවතී. මෙය පැහැදිලි කිරීම් සඳහා Augusto Boal වේදිකා නාට්‍ය කලාව භාවිත කරන ආකාරය විමසා බලමු.

පීඩිතයන් වෙනුවෙන් තම නාට්‍යකරණය මෙහෙයවූ Augusto Boal ප්‍රේරණය වූයේ Paulo Freireගේ විමුක්තිකාමී ඉගැන්වීම හෙවත් Pedagogy of Liberation නමැති චින්තනය මඟිනි. Boalගේ මේ නාට්‍යකරණය හැඳින්වූයේ 'පීඩිතයාගේ නාට්‍ය කලාව' යනුවෙනි.

වචනාර්ථයෙන්ම සඳහන් වෙන පරිදි Boal මෙහිදී නාට්‍යය නමැති කලා මාධ්‍යය භාවිත කරන්නේ ආන්තීකරණය වූ, හඬක් නැති ජන කණ්ඩායම්හි හඬ සමාජය ඇතුළත මතු කරගැනීමටත්, ඔවුන්ව බලායනය කිරීමටත්ය. ඔහුගේ මූලිකම අදහස වූයේ සමාජයේ බහුතරයක් දෙනා කුමන හෝ ආකාරයෙන් පීඩාවට ලක්වී ඇති බවත්, මේ ව්‍යුහාත්මක පීඩාකාරී තත්ත්වවලට අභියෝග කිරීම සමාජීය ක්‍රියා මතින් කළ හැකි බවත්, ඒ මතින් පුද්ගලයන්ට විමුක්තිය අත්කර දිය හැකි බවත්ය.

මෙහිදී Boalගේ මූලිකම උත්සාහය ප්‍රේක්ෂකයා වීරයකු බවට පත් කිරීමයි. Boalගේ අදහස නම් සෑම පුද්ගලයකුටම වේදිකා නාට්‍ය කලාවේ නිරතවීමට ශක්‍යතාවක් ඇති බවයි. Forum Theatre යන නාමයෙන් හඳුන්වන ඔහුගේ මූලික ආකෘතියේ විවිධ තාක්ෂණික සහ ශිල්පක්‍රම භාවිත කරමින් සහභාගි වන්නන් තමන්ගේම ආඛ්‍යානයේ චරිත බවට පත් කරයි. Boalගේ මේ සංකල්පය ඵලදායී ලෙසට සමාජ වෘත්තවේදය ඇතුළත ගැටලු ගවේෂණය කිරීමට මෙන්ම පීඩකයා සහ පීඩිතයා යන දෙපාර්ශ්වයම පරිවර්තනය කිරීම සඳහා භාවිත කළ හැකි වෙයි. එහිදී සමාජ වෘත්තවේදියකුට කළ හැකි කාර්යය වන්නේ පාර්ශ්ව දෙකම ගැටලුව තමන් දරන දෘෂ්ටිකෝණ හරහා සියුම්ව විමර්ශනය කර ඒ තත්ත්වවල ඇති පීඩාකාරී ස්වරූපය හඳුනා ගැනීමයි. මේ වේදිකා නාට්‍ය කලාව බොහෝවිට භාවිතයට ගත හැක්කේ විසඳුමක් ලබාගත නොහැකි පීඩාකාරී තත්ත්වලදී විසඳුම සෙවීම සඳහාය. මෙහිදී ප්‍රේක්ෂාගාරයට එම රංගයෙහි නළුවන් බවට පත්වෙමින් විකල්ප විසඳුම් වේදිකාවේදී ගවේෂණයට ලක් කිරීමට හැකිවෙයි. දෛනික ජීවිතයේ මතුවෙන ගැටලුවලදී පිළිතුරු සඳහා පෙර සූදානම් වීමේ මාර්ගයක් ලෙසට ද මෙය හඳුනාගත හැකිය. මෙහිදී සිදුවන්නේ බාධා මැඬ ගැනීමට වින්දිතයාට උදව්වීමයි. මේ අනුව වේදිකාව යනු මුණ ගැසීමට සන්නිවේදනය කිරීමට මෙන්ම සමාජයේ හඬක් ලබා ගැනීමට සහ තමන්වම ඉහළට ඔසවා තබමින් මහජන අවකාශයක් බවට පත්වීමයි. මෙහිදී සිදුවන්නේ බාධා මැඬ ගැනීමට වින්දිතයාට උදව් කිරීමයි. මේ අනුව වේදිකාව යනු මුණ ගැසීමට සන්නිවේදනය කිරීම මෙන්ම සමාජය ඇතුළත හඬක් නැඟීම සහ තමන්වම ඉහළට ඔසවා තැබීමේ මහජන අවකාශයක් බවට පත්කර ගැනීමයි. එසේම එම තීරණ ගැනීමට, සාකච්ඡා

කිරීමට මෙන්ම තම පුද්ගල භාවය වර්ධනය කිරීමේ තම කුසලතා ගොඩනැංවීමේ මාධ්‍යයක් ද වේ. කලාවේදී අප ගනුදෙනු කරන්නේ සංකේත ලෝකයක් සමඟ බැවින් මා පෙරදී සඳහන් කළ ආකාරයට වින්දිතයාට ඉතා ආරක්ෂාකාරී ලෙස තම ගැටලුවට විසඳුම් සෙවීමේ මාවතක් ලෙස වේදිකාව භාවිත කළ හැකිය. ශ්‍රී ලාංකේය කෝලම් නාට්‍ය මේ ගණයේ මේ ගුණය ප්‍රාථමික ලෙස ගැබ් කරගත් දේශීය නාට්‍ය ක්‍රමයක් ලෙස සැලකිය හැකි අතර, සූර සමාජ වෘත්තවේදියකුට Boalගේ නාට්‍ය කලාව මෙන්ම කෝලම් වැනි දේශීය ජනරංගයෙහි ද පිහිට ලබමින් පීඩිත, ආන්තික ජනකණ්ඩායම්වල ගැටලුවලට ආමන්ත්‍රණය කිරීම විශිෂ්ට ලෙස සිදු කළ හැකිය. මෙය සාර්ථක ලෙස අත්හදා බැලූ ශ්‍රී ලාංකේය උදාහරණයක් නම් මන්ද ආබාධිත දරුවන් වෙනුවෙන් වැඩකරන සුනෙර ආයතනය මඟින් ඒ දරුවන් සඳහා රෝහණදේව පෙරේරා ප්‍රමුඛ නාට්‍ය කණ්ඩායම සමඟ පවත්වනු ලැබූ නාට්‍ය වැඩමුළුවයි. එමඟින් ඒ දරුවන්ගේ සන්නිවේදන දුර්වලතා මෙන්ම මානසික සංකුලතා මඟ හරවා ගැනීම සඳහා ද යහපත් දායකත්වයක් ලබා දෙන ලදි.

## අවසන් සටහනඃ ශ්‍රී ලාංකේය ප්‍රවණතා

මේ ලිපිය රචනා කිරීමේදී ලංකාවේ ප්‍රධාන විශ්වවිද්‍යාල ත්‍රිත්වයක සහ සමාජ වෘත්තවේදය උගන්වන ප්‍රධාන ආයතනවල විෂයය මාලා සියුම් ලෙස නිරීක්ෂණය කළ අතර, පාඨමාලා අතර සමාජ වෘත්තවේදය උගැන්වීම්හි සෞන්දර්යය කලා විෂයයන් පිළිබඳ අවධාරණය කෙරෙන එකදු පාඨමාලාවක් හෝ තිබුණේ නැත. ඒ පාඨමාලා ප්‍රධාන වශයෙන් කොටස් ත්‍රිත්වයක් මත සංවර්ධනය වී ඇති බව පෙනේ. ඒවා නම් සංකල්පීය සහ න්‍යායික පුහුණුව සපයන පාඨමාලා, ක්ෂේත්‍ර පුහුණුව ඉලක්ක කරගත් ක්‍රමවේද පිළිබඳ පාඨමාලා සහ ක්ෂේත්‍ර වැඩ ඉලක්ක කරගත් (parctice based courses) පාඨමාලා ආදි වශයෙනි. මේ පාඨමාලා සියල්ලෙහි මූලික ලක්ෂණය නම් ඒවා වඩා වාස්තවික සහ ආනුභවික තත්ත්ව වඩා තියුණු කිරීම සඳහා ගොඩනඟා ඇති පාඨමාලා බවයි. න්‍යායික සහ සංකල්පීය තලය ඉලක්ක කරගත් පාඨමාලා වැඩි වශයෙන්ම බටහිර න්‍යායකරණය පදනම් කරගත් සමාජ වැඩ, මනෝ විද්‍යාව සහ මානව විද්‍යා ප්‍රවේශයන්ගෙන් සැදුම්ලත් ඒවායි.

මෙහිදී මතුවිය හැකි එක් ගැටලුවක් නම් මේ බහුවිධ න්‍යාය අවශ්‍ය තන්හිදී එකින්එක මුසු කරමින් නිර්මාණශීලීව එය භාවිත කරන්නේ කෙසේද යන්න පිළිබඳව සැකසංකාවක් මතුවිය හැකි වීමයි. එවැනි ගැටලු අතික්‍රමණය කිරීමට නම් සමාජ වෘත්තවේදියා විෂයය ක්ෂේත්‍ර දෙකෙහිම ප්‍රවීණත්වයකින් හෙබි අයෙකු විය යුතුය; සමාජ න්‍යාය පිළිබඳ සුවිශේෂී පුහුණුවකුත්, යම් හෝ කලා මාධ්‍යයක් පිළිබඳ ප්‍රාමාණික දැනුමකුත් තිබිය යුතුය. අවාසනාවට තත්කාලීන ශ්‍රී ලාංකේය සමාජ වෘත්තවේදය උගන්වන ශාස්ත්‍රඥයන්ගෙන් එවැනි ප්‍රාමාණික පුහුණුවක් ඇත්තේ ඉතාම අතළොස්සක් පමණ වන පිරිසකට විය හැකිය; එම කලා මාධ්‍ය සමඟ ගනුදෙනු කිරීම ඔවුන් මේ වනවිට අතහැර දමා හෝ ඒවා වඩා නිර්මාණශීලි ලෙස භාවිත කිරීම පිළිබඳ අවශ්‍ය පුහුණුව නොමැති වීම හෝ විය හැකිය. එසේම එවැනි භාවිතවලට යොමු වීමේදී බටහිර කේන්ද්‍රීය න්‍යායික හා භාවිත ස්වදේශික සංස්කෘතික සන්දර්භයට සාක්‍යලයෙන්ම නොගැළපීමට ද ඉඩ ඇත. ඒවා දේශීය කලා භාවිත සමඟ මුසු කරගත යුත්තේ ඉතා පරිස්සමෙනි. මීළඟට පැන නැඟිය හැකි බරපතළම ගැටලුව නම් සමාජ වෘත්තවේදියා තම විෂයය සහ කලාව අතර දේශසීමා නිසියාකාරව සහ ආචාර ධාර්මිකව කළමනාකරණය කරගන්නේ කෙසේද යන ප්‍රශ්නයයි.

මීට අමතරව සෞන්දර්යය කලා කටයුතු සමාජ වෘත්තවේදී විෂය මාලාවලට අන්තර්ගත නොවීමට එක් හේතුවක් නම් ඒ පිළිබඳ නිසි පුහුණුව ලත් වෘත්තිකයන් නොසිටීමයි. එමෙන්ම ඒ පිළිබඳ පවතින අනවබෝධය සහ තේරුම් නොගැනීම ද විය හැකිය. මා පෙරදී සඳහන් කළ පරිදි පශ්චාද් යටත් විජිත රාජ්‍යවල විද්‍යාව ක්‍රියාත්මක වන්නේ එක්තරා හීනමාන මානසිකත්වයක් ඇතුළතය. සෞන්දර්යය කලා විෂය මේ විෂයයන් ඇතුළට රැගෙන ඒම අලුතෙන් පිහිටුවන විෂයයන්වල විද්‍යාත්මක බව හීනවීමට හේතුවක් වෙනවා යැයි ඔවුන් කල්පනා කරනවා විය හැකිය. මෙහි වර්ධන ලෙස ආයතනික සීමා පැනවීම්, සංස්කෘතික සංජානන මෙන්ම අධ්‍යාපනික ක්ෂේත්‍රයේ පවතින යටිතල පහසුකම් ද සලකා බැලිය හැකිය. මේ පිළිබඳව අදහස් දැක්වූ එක් ආචාර්යවරයකු පැවසුවේ "ඔය ඔක්කොම කරන්න කොහෙද වෙලාව තියෙන්නෙ..." යනුවෙනි. මෙහිදී ගම්‍ය වන එක් කාරණයක් නම් මා පෙර කී ආකාරයට විද්‍යාත්මක ඥානය මත

පදනම් වූ වෘත්තිමය පුහුණුව අධිනිශ්චය වීම වන අතර, සෞන්දර්යය කලා එහි පරිවාරයේ තිබෙන දෙයක් ලෙසටයි. එවැනි දේවල් කිරීමට තමන්ට පුහුණුවක් නැති බව තවත් එක් ආචාර්යවරයෙකු පැවසූ අතර, වෙනත් ආචාර්යවරයෙකු පැවසුවේ, "මේක තාම මෙහේ මුල් බැහැ ගන්න විෂයයක්..." යනුවෙනි. මේ කරුණු සියල්ල සලකා බලන විට පෙනී යන්නේ සමාජ වෘත්තවේදී විෂයය මාලාව සෞන්දර්යය විෂයය කලා කටයුතුවලට අන්තර්ග්‍රහණය කරගැනීමට තව බොහෝ කාලයක් ගතවනු ඇති බවයි.

## References

Barlow, C., & Hall, B. L. (2007). What about feelings? A study of emotion and tension in social work education. *Social Work Education, 26*(4), 399–413.

Becker, H. S. (2008). *Art Worlds*. University of California Press.

Boal, A. (1979). *The Theatre of the Oppressed*. Pluto Press.

Bos, E., & Huss, E. (2019). *Art in Social Work Practice Theory and Practice: International Perspectives*. Routledge.

Bourdieu, P. (1993). But who created the creators? In *Sociology in Question* (pp. 139–148). Sage.

Carpenter, J., & Webb, C. (2012). What can be done to promote the retention of social workers? A systematic review of interventions. *British Journal of Social Work, 42*(7), 1235–1255. https://doi.org/10.1093/bjsw/bcr144

Csikszentmihalyi, M., & Csikzentmihaly, M. (1990). *Flow: The Psychology of Optimal Experience* (Vol. 1990, p. 1). New York: Harper & Row.

Dominelli, L. (2006). Community development across borders: Avoiding dangerous practices in a globalizing world. *International Social Work, 48*(6), 702–713.

Fanon, F. (1963). *The Wretched of the Earth*. Grove Press.

Hooks, B. (1992). *Black Looks: Race and Representation*. Turnaround.

Huss, E. (2012). Art and social work: A creative approach to empowerment and healing. *Journal of Social Work Practice, 26*(1), 5–19.

Huss, E. (2015). *Using Art for Social Transformation*. Routledge.

Huss, E., & Cwikel, J. (2005). Art therapy and social work: A collaborative framework for empowerment. *Art Therapy: Journal of the American Art Therapy Association, 22*(4), 183–190.

Huss, E., & Sela-Amit, M. (2019). Art in social work: Do we really need it? *Research on Social Work Practice, 29*(6), 721–726.

Kaufman, R., Huss, E., & Segal-Engelchin, D. (2011). Social work students' changing perceptions of social problems after a year of community intervention. *Social Work Education, 30*(8), 911–931.

Leavy, P. (2015). *Arts-based research: A field in motion*. Guilford Press.

Lyubomirsky, S. (2008). *The How of Happiness: A new approach to getting the life you want*. Penguin Press.

McNiff, S. (2008). *Art-Based Research*. Jessica Kingsley Publishers.

Mishna, F., & Bogo, M. (2007). Reflective practice in contemporary social work classrooms. *Journal of Social Work Education, 43*(1), 15–23.

Narhi, K. (2001). Transferable and negotiated knowledge: Constructing knowledge for the future. *Journal of Social Work, 2*(3), 317–336. https://doi.org/10.1177/146801730200200304

Smirnova, A., & Poluektova, N. (2023). Social arts for recognition: Sociological perspectives on arts and youth identities. In E. Bos & E. Huss (Eds.), *Using Art for Social Transformation: International perspectives for social workers, community workers and art therapists* (pp. xx–xx). Routledge.

Walton, P. (2012). Beyond talk and text: An expressive visual arts method for social work education. *Social Work Education, 31*(6), 724741. https://doi.org/10.1080/02615479.2012.695934

White, M., & Epston, D. (1990). *Narrative Means to Therapeutic Ends*. Norton & Company.

Zelizer, C. (2003). The role of artistic processes in peacebuilding in Bosnia-Herzegovina. *Peace and Conflict Studies, 10*(2), 62–75.